# සසුන් පිළිවෙත



කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු

# සසුන් පිළිවෙත

(පහන් කණුව දෙසුමකි.)

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

ISBN 978-955-1255-38-1

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම

ප්‍රකාශනය
ධම්ම්ග්‍රන්ථ මුද්‍රණ භාරය
2011

ධම්මදානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2011 මාර්තු

පොත ලබාගත හැකි ස්ථාන

1. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.

2. රෝයල් ඉන්ස්ටිටියුට්,
191, හැව්ලොක් පාර, කොළඹ 5.

3. ඩී. ටී. වේරගල මහතා
422, වැලිපාර, තලවතුගොඩ.

4. අනුර රූපසිංහ මහතා
27, කොළඹ වීදිය, මහනුවර

5. හේමා රූපසිංහ මිය
26, හැව්ලොක් පාර, ගාල්ල.

6. එස්. ඒ. ලයනල් මහතා
140/19, රුහුණුසිරි උද්‍යානය,
හක්මණ පාර, මාතර.

7. වෛද්‍ය පී. වීරසිංහ මහතා
බණ්ඩාර බුලංකුලම,
ලංකාරාම පාර, අනුරාධපුර.

8. එම්.ජී. හේමචන්ද්‍ර මහතා
17/3, ඕනෑගම, පොළොන්නරුව.

9. මහා භාරකාර දෙපාර්තමේන්තුව
2, බුලර්ස් පටුමග, කොළඹ 07.

වෙබ් අඩවිය: www.seeingthroughthenet.net

මුද්‍රණය
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
ටෙලි : 011-4870333

# පටුන


| | පිටු |
|---|---|
| හැදින්වීම | iv |
| ප්‍රකාශක නිවේදනය | v |
| ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායකවීම | vii |
| අමාගඟ | viii |
| ධර්ම දේශනා සංයුක්ත තැටි. | ix |
| පහන් කණුව දෙසුම් - අංක 139 | 1 |

# සසුන් පිළිවෙත

## හැඳින්වීම

**(ප්‍රථම මුද්‍රණය)**

මල්ලක් තුළ සැඟවුන රන් බඳුනකින් මතුවුන අගනා ශාසනික පණිවිඩයක් මේ පහන් කණුව දෙසුමෙන් හෙළිපෙහෙළි වෙයි. රන් බඳුනටද වඩා අගනා එම ශාසනික පණිවිඩය පාඨක ලෝකයා හමුවේ තැබීම කාලෝචිත සසුන් මෙහෙවරයකැයි සැලකූ ධර්මග්‍රන්ථ මුද්‍රණයභාරයේ ජී.ටී. බණ්ඩාර මහතා කළ ඇරයුම අනුව සකස් වූ මේ කුඩා පොතෙහි ඇතුළත් වනුයේ අංක 139 දරණ පහන් කණුව දෙසුමයි.

මේ වනවිට අප විසින් පහන් කණුව දෙසුම් 175 ක් දේශිත නමුදු තවම මුද්‍රණද්වාරයෙන් නිකුත් වී ඇත්තේ දෙසුම් 45ක් පමණය. එසේද වුවත් මහනුවර ධර්මශ්‍රවණ මාධ්‍යභාරයෙන් ඒ දෙසුම් සියල්ලම තැටිගත කර නොමිලයේ බෙදාහරින බැවින් ධර්මකාමී පින්වතුන්ට ඒවා ශ්‍රවණය කිරීමට අවස්ථාව සැලසී ඇත. යථාකාලයේදී හැකිතාක් දෙසුම් මුද්‍රණය කිරීමට ධර්මග්‍රන්ථ මුද්‍රණභාරය දැඩි උද්‍යෝගයක් දක්වන අතර සසුන් වැඩ කැමති පරිත්‍යාගශීලී සැදැහැවතුන්ගේ අනුග්‍රහයද එයට නොඅඩුව ලැබෙන බව පෙනේ.

වයෝවෘද්ධ අවස්ථාවේ පසුවන තම මැණියන් වන පී. ටිකිරිමැණිකේ මහත්මියට නිරෝගි සුව පතමින් මෙම ප්‍රථම මුද්‍රණය එළිදැක්වීමට ජී.ටී. බණ්ඩාර මහතා ඉදිරිපත් වූ අතර මැණිකේ දිසානායක මහත්මිය සහ යූ. මාපා, ආතර් වෙදමුල්ල යන මහත්වරුද සැදැහැසිතින් ධර්මදානයට දායක වූ බැවින් ඔවුන් සැමටම එයින් ජනිත කුශලය පරම ශාන්ත උතුම් නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය සම්පත්තියක්ම වේවායි පතමු.

මෙයට,

සසුන්ලැදි

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
"පහන්කණුව"
කන්දේගෙදර, දේවාලේගම.
(2554) 2011 පෙබරවාරි

# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ "නිවනේ නිවීම" දේශනා මුද්‍රණය කොට, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයහට එම දහම් පොත් ලබාදීමේ මූලික අදහස අප තුළ ඇතිවී මුත්, මුද්‍රණය සඳහා වැය වන මුදල උපයා ගැන්ම ප්‍රශ්නයක් විය. එය විසඳීම පිණිස අප කිහිප දෙනෙක් යෝජනා කළේ වැයවන මුද්‍රණ වියදම පමණක් අය කර ගැන්මට ප්‍රමාණවත් වූ මිලකට එම දහම් පොත් විකිණීමයි. එහෙත්, අපගේ එම යෝජනාව ගරු ඤාණනන්ද ස්වාමීන් වහන්සේ එකහෙලා ප්‍රතික්ෂේප කරමින් "ධර්මය මිල කරන්න බැහැ, එය අවශ්‍ය අයහට නොමිලේ ලබා ගැන්මට හැකිවිය යුතුයි..." කීහ.

එබැවින් උන්වහන්සේ අදහස් කළ පරිදි මුලින්ම මුද්‍රණය කල "නිවනේ නිවීම" දේශන මාලාව සඳහා වියදම් ලබා ගැන්මේ වැඩ පිළිවෙලක් වශයෙන් රෝයල් ඉන්ස්ටිටියුට් හි අධිපති ජී.ටී.බණ්ඩාර මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් අරමුදලක් අරඹනු ලැබීය. එවකට මහා භාරකාර ධූරය දරූ යූ. මාපා මහතාගේ අදහසක් අනුව පිහිටුවන ලද එකී භාරයෙහි අරමුණ වූයේ මෙම පුණ්‍ය ක්‍රියාව ඉටුකර ගැනීම සඳහා දායක වීමට කැමති අය හට මුදලින් කෙරෙන තම පුණ්‍යාධාර එම භාරයට බැර කිරීමට අවස්ථාව සළසා දීමයි.

1997 වසරේදී ඇරඹුනු මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පූජ්‍ය ඤාණනන්ද හිමියන්ගේ දේශනා 33 කින් යුත් "නිවනේ නිවීම" වෙළුම් 11 කින් මුද්‍රණය කොට නොමිලේ බෙදා දීමට අමතරව පසළොස්වක පොහෝ දිනයන්හිදී පහන් කණුව සෙනසුන වෙත රැස්වෙන උපාසක උපාසිකාවන් සඳහා උන්වහන්සේ විසින් කෙරෙන ධර්ම දේශනා "පහන් කණුව ධර්ම දේශනා" නමින් මේ වන විට ග්‍රන්ථ 7ක් පළකොට තිබේ. එතැනින් නොනැවතී උන්වහන්සේගේ අනෙකුත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථද එසේම ධර්ම දාන වශයෙන් පළකිරීමට හැකිවීම ඊට දායක වූ අප සැමගේ ඉමහත් සතුටට හේතුවිය.

අති පූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ එම ධර්ම දේශනා අගයමින් එම සත්කාර්යය නොනවත්වා කරගෙන යෑම පිණිස දායක භවතුන්ගෙන් අප වෙත ලැබෙන පැසසුම් සහිත ප්‍රතිචාරය නිසාම ඒ අයගේ පහසුව පිණිස අප විසින් මෑතකදී "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ජංගම ගිණුම විවෘත කරන ලදී.

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණානන්ද හිමියන් විසින් පහදා දෙනු ලබන නිර්මල බුදු දහම ඔබ අතට පත් කිරීම අපගේ එකම අරමුණයි. ඊට ඔබගෙන් ලැබෙන දායකත්වය ඉමහත් කුශලයකි. අපට ඉමහත් ධෛර්යයකි.

මෙම වටිනා ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීමේ සම්පූර්ණ කාර්යභාරය ජී. ටී. බණ්ඩාර මහතා විසින් රෝයල් ඉන්ස්ටිටියුට් හි පින්වත් නිලධාරීන්ගේ සහායද ඇතිව වෙහෙස මහන්සි නොබලා ඉටුකර දීම ගැන අපගේ බලවත් ප්‍රසාදය මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතු වේ.

මෙයට,
සසුන් ලැදි
**ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරකාර මණ්ඩලය**

# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම, "නිවනේ නිවීම" සහ "පහන් කණුව ධර්ම දේශනා" නමින් පළ වී ඇති දහම් පොත් තුළින් මේ වන විටත් ඔබ ඇතැම් විට කියවා තිබිය හැක.

එම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා හැකි පමණ මුද්‍රණය කොට නොමිලේ බෙදා දීම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අරමුණයි.

මෙතෙක් එම භාරය මගින් පළකොට ඇති ධර්ම ග්‍රන්ථ එකී ග්‍රන්ථ වල අවසාන පිටුවෙහි දක්වා ඇත.

මෙම මහඟු පුණ්‍ය ක්‍රියාව සඳහා දායක වීමට කැමති පින්වතුන්, පහත සඳහන් උපදෙස් පිළිපැදීම මැනවි.

1. චෙක්පත් මගින් එවන සියලු ආධාර "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ගිණුමට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකිය.

2. දිවයිනේ පිහිටි ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් ඔබගේ ආධාර මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කල හැක.

3. කෙසේ වුවද, ඔබගේ පහසුව පිණිස සියලු පුණ්‍යාධාර කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 191 හි පිහිටි රෝයල් ඉන්ස්ටිටියුට් ආයතනයේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය වෙනුවෙන් පිහිටුවා ඇති අංශයටද බාර දිය හැක.

4. මෙම භාරය මගින් නිකුත් කැරෙන ධර්ම ග්‍රන්ථ මගින් ඔබගේ දායකත්වය වරින් වර දායක භවතුන්ගේ දැනගැන්ම සඳහා පළ කරනු ඇත.

5. ඔබ විසින් කරනු ලබන ආධාරය බැංකු ගිණුමට බැර කරන විට ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියෙහි ඡායා පිටපතක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් මෙම ධර්ම දානමය කටයුත්තට දායක වන ඔබගේ නම සහ දායක මුදල අප විසින් වරින් වර පළ කරන දායක ලැයිස්තුවෙහි ඇතුළත් කිරීම කළ හැකිය.

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්
අංක 191, හැව්ලොක් පාර
කොළඹ 05

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මහට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

"ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්මදේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මෙයට,

සසුන් ලැදි

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම
2000 ජුනි 05 (2544 පොසොන්)

## ධර්ම දේශනා සංයුක්ත තැටි

මෙම ධර්මදාන වැඩපිළිවෙලෙහි දෙවෙනි අදියර වශයෙන් පිහිටුවන ලද මහනුවර ධර්මශ්‍රවණ මාධ්‍ය භාරය මගින් සකස් කරනු ලබන ධර්මදේශනා සංයුක්ත තැටි දනට ධර්මදාන පොත පත බෙදාහරින ස්ථාන කිහිපයෙන් ධර්මශ්‍රවණාභිලාෂීන්ට නොමිලයේම ලබාගත හැකිය.

ධර්මශ්‍රවණ මාධ්‍ය භාරයේ ධර්මදාන කටයුතු වලට සහායවනු කැමති පින්වතුන් ඒ පිළිබඳව පහත සඳහන් දුරකථන අංකයකට විමසීම් යොමු කිරීම මැනවි.

1. අනුර රූපසිංහ මහතා
   අංක: 27, කොළඹ වීදිය, මහනුවර.
   දු:ක: 081-2232376

2. එම්.එම්.කේ. සිරිසේන මහතා
   දු:ක: 071-8248608

# නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

**පුච්ඡාමි මුනිං පහූතපඤ්ඤං (ඉති චුන්දො කම්මාරපුත්තො)**
**බුද්ධං ධම්මස්සාමිං වීතතණ්හං**
**දිපදුත්තමං සාරථීනං පවරං**
**කති ලොකෙ සමණා තදිඞ්ඝ බ්‍රෑහි**

**චතුරො සමණා න පඤ්චමොත්ථි (චුන්දාති භගවා)**
**තෙ තෙ ආවිකරොමි සක්ඛිපුට්ඨො**
**මග්ගජිනො මග්ගදෙසකො ච**
**මග්ගෙ ජීවති යො ච මග්ගදූසී ති**

***- සුත්ත නිපාතය - චුන්ද සූත්‍රය***

සැදැහැවත් පින්වතුනි,

බුද්ධ කාලීන සමාජයේ පැවතුන 'සමණ' කියන වචනය පොදුවේ බුදුරජාණන් වහන්සේත්, බුදුරජාණන් වහන්සේගේ පැවිදි ශ්‍රාවකයන් වහන්සේලාත් හඳුන්වන්න ව්‍යවහාර වුනා. මේ 'ශ්‍රමණ' කියන වචනයට ශාසනානුලෝමික, ශාසනයට ගැලපෙන, අර්ථයක් දීමට බුදුරජාණන් වහන්සේ නිතරම උත්සාහවත් වුනා. දන් අපි මේ මාතෘකා කළ ගාථා දෙකෙන් කෙරෙන්නේත් ඒ වගේ අර්ථ විග්‍රහයකට ආරාධනාවක්. සුත්ත නිපාතය කියන ධර්ම ග්‍රන්ථයේ චුන්ද සූත්‍රය කියන සූත්‍රයේ සඳහන්වන ආකාරයට චුන්දකර්මාර පුත්‍රයයි මෙන්න මේ 'ශ්‍රමණ' කියන පදය පිළිබඳ විග්‍රහයට ආරාධනාව කළේ.

චුන්දකර්මාර පුත්‍රයා කියන ඒ උපාසක මහත්මයා ගැන මේ පින්වතුන් අහලත් ඇති. බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයට කලින් අවසාන දානය පිළිගැන්වූ දායකයා හැටියට. බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පෑමට කුසිනාරාව බලා වැඩම කරන අවස්ථාවේදී පාවා නුවරට ඒ මහා සඟ පිරිසත් පිරිවරාගෙන වැඩම කරලා චුන්දකර්මාර පුත්‍රයාට අයිති අඹවනයේ වැඩ වාසය කළා. තමන්ගේ අඹවනයට බුදුරජාණන් වහන්සේ පැමිණි බව අහලා චුන්දකර්මාරපුත්‍රයා ඇවිත් බුදුරජාණන් වහන්සේට වන්දනා කළාම බුදුරජාණන් වහන්සේ ධර්ම කථාවකින් ඒ චුන්ද උපාසක උන්නැහේව උත්සාහවත් කළා. මේ චුන්දකර්මාර පුත්‍රයා කලින් අවස්ථාවක බුදුරජාණන්වහන්සේ හමුවෙලා ධර්මකථාවකින් පැහැදිලා ශ්‍රාවකයෙක් වෙච්ච උපාසක මහත්මයෙක්. ඉතින්

ඒ බලවත් ශ්‍රද්ධාවක් ඇතිකරගෙන මේ චුන්දකර්මාර පුත්‍රයා බුද්ධ ප්‍රමුඛ සංඝයාවහන්සේලාට පසුදින දානය සඳහා තමන්ගේ නිවසට වැඩම කරන හැටියට ආරාධනා කළා. බුදුරජාණන් වහන්සේත් නිහඬභාවයෙන් ඒක පිළිගෙන වදාළා.

ඉතින් ඒ චුන්දකර්මාර පුත්‍රයා නිවසට ගිහිල්ලා පසුදින ප්‍රණීත ආහාර පාන පිළියෙල කළා. ඒ එක්කම එතැන සඳහන් වෙනවා සෑහෙන ප්‍රමාණයක් 'සූකරමද්දව' කියල දේකුත් පිළියෙල කළ බව. මෙන්න මේ 'සූකරමද්දව' කියන වචනය ශාසන ඉතිහාසයේ බොහොම විවාදයට භාජනය වුනු වචනයක්. මේකේ දීර්ඝ විග්‍රහයක් නොකළත් පළමුව ආරම්භයේදී අපට කියන්න වෙන්නේ අටුවාවේ තෝරන හැටියට නම් අර්ථ තුනක් දෙනවා. පළමු අර්ථය දෙන්නේ නොමේරූ ඌරෙකුගේ මස් කියලා. දෙවන අර්ථය දෙන්නේ පස්ගෝරස. ඒ කියන්නේ ගවයාගෙන් ලබාගත්තු කිරි, දීකිරි, ගිතෙල් ආදිය යෙදූ මෘදු බතක් හැටියට. ඒ දෙවන අර්ථයක් දෙනවා. තුන්වෙනි අර්ථය දෙනවා රසායන ශාස්ත්‍රයේ සූකරමද්දව නමින් සඳහන්වන රසායනයක්ය කියලා. ඉතින් ඕන්න ඕහොම. අපි කොයිහැටි හෝ වේවා මේ අවස්ථාවේ සූකර මද්දව කියන වචනය භාවිතා කරමු.

ඉතින් ඕන්න චුන්දකර්මාර පුත්‍රයා අර විධියට නොයෙකුත් ආහාර ද්‍රව්‍ය සමඟ මෙන්න මේ සූකර මද්දවයත් පිළියෙල කරලා බුදුරජාණන් වහන්සේට අද දානය සූදානම් කියන එක දැන්වූවාම බුදුරජාණන් වහන්සේ සඟපිරිසත් සමඟ වැඩම කරලා වැඩහුන් හැටියෙම වගේ චුන්දකර්මාර පුත්‍රයාට කථාකරලා වදාළා 'චුන්ද ඔය යම් සූකරමද්දවයක් සූදානම් කරලා තියෙනවා නම් එයින් මට සංග්‍රහකරන්න. අනික් ආහාර සංඝයාවහන්සේලාට පිරිනමන්න' කියලා. එයින් අදහස් කළේ අනිත් සංඝයාවහන්සේලාට මේ සූකරමද්දවය දෙන්න එපා කියන එකයි. චුන්දත් 'එසේය ස්වාමීනි' කියලා ඒ විදියට බුද්ධප්‍රමුඛ සංඝයා වහන්සේලාට දානය පිළිගැන්වූවා. වළඳලා අවසානයේදී බුදුරජාණන් වහන්සේ චුන්දට කථා කරලා කියනවා "චුන්ද ඔය යම් සූකරමද්දවයක් ඉතිරිවෙලා තියෙනවා නම් ඒක වළක් හාරලා වළ දමන්න. මට පෙනෙන්නේ නැහැ දෙවියන් මාරයින් බ්‍රහ්මයින් සහිත මේ ලෝකයේ මේ ආහාරය අනුභව කරලා දිරවාගන්න පුළුවන් කෙනෙක් තථාගතයන් වහන්සේ හැර" කියලා එහෙම විශේෂ ප්‍රකාශයකුත් කළා. ඉතින් චුන්ද ඒ කියාපු විධියට ඉතිරි කොටස වළ දැම්මා.

ඊළඟට ඒ මහාපරිනිර්වාන සූත්‍රයේ එන විස්තරය අනුව අපට පෙනෙන්නේ ඒ ආහාරය වැළඳුවාට පස්සේ බුදුරජාණන් වහන්සේට ලෝහිතපක්ඛන්දිකා නම් වූ දැඩි ආබාධයක්- ලේ විරේචනයවන ආබාධයක් පැන නැගුන බවයි. මීට කලින් අපි මතක තබාගත යුතුව තියෙනවා, බේලුව ගමේදී බුදුරජාණන් වහන්සේ අවසාන චාරිකාව වඩින අතරේ ඒත් බරපතල ආබාධයක් ඇවිල්ලා

ආනන්ද ස්වාමීන් වහන්සේත් බොහොම සංවේගවත් වුනා භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන් - පායි කියලා. නමුත් බුදුරජාණන් වහන්සේගේ අධිෂ්ඨාන ශක්තිය තුළින් ජීවිත සංස්කාර අධිෂ්ඨාන කරලා ඒක සතිසම්පජඤ්ඤයෙන් ඒ වීර්යයෙන් ඒ රෝගය යටපත් කරගත්තා. එතකොට ඒ යටපත් කරගත්තු ඒ රෝගයයි මේ මතුවුනේ කියලා අපි හිතාගන්න ඕනෑ.

ඉතින් කොහොම නමුත් මේ විරේචනය වීම ඇතිවුනා. නමුත් බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්වාමීන්වහන්සේට වදාළා "ආනන්ද, අපි යමු කුසිනාරාවට" කියලා කුසිනාරාව බලා පිටත්වුනා. දැන් අද අපි මේ මාතෘකා කරගත්තු ගාථා දෙකට අදාළ සිද්ධිය ඇත්ත වශයෙන් සිද්ධ වුනේ චුන්දගේ දාන ශාලාවේදී. නමුත් අපි දාන ශාලාවට පස්සේ එමු. අපි බුදුරජාණන් වහන්සේත් එක්ක ටික දුරක් පසුගමන් කරමු. මොකද මේ සූකරමද්දවය පිළිබඳ යමක් ඒ අතරමඟදී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ නිසා.

ඉතිං ඔන්න බුදුරජාණන් වහන්සේ ඒ ආනන්ද ස්වාමීන් වහන්සේගේ උපස්ථායකත්වය ඇතිව චුන්දක කියලා තවත් ස්වාමීන් වහන්සේ උපස්ථායක වශයෙන් ගිය බව සඳහන් වෙනවා කථා ප්‍රවෘත්තිවල- සඟ පිරිස එක්ක පාවා සිට කුසිනාරා දක්වා තිබෙන දීර්ඝ මාර්ගයේ - සුළුකොට තැකියයුතු දුරක් නොවේ. නමුත් උන්වහන්සේ වැඩම කළා. වැඩමකරලා කුසිනාරාවට සමීප වූ කකුත්ථා කියලා ගඟක් තියෙනවා. ඒ ගඟ සමීපයට වැඩියට පස්සේ බුදුරජාණන් වහන්සේට බොහොම ගිලන්. බුදුරජාණන් වහන්සේ ඒ මාර්ගයෙන් ඉවත්වෙලා ගසක් මුලට වැඩම කරලා ආනන්ද ස්වාමීන් වහන්සේට කිව්වා. "ආනන්ද මට බොහොම ක්ලාන්තයි. සිවුර හතරගුණයක් කරලා එලන්න" කියලා. ඉන්පසු බුදුරජාණන් වහන්සේ එතැන වැඩ උන්නා. වැඩ ඉඳලා බුදුරජාණන් වහන්සේ කිව්වා"ආන්නද මට පිපාසයි මට පැන් ටිකක් ගෙනෙන්න" කියලා. ඉතින් ආනන්ද ස්වාමීන් වහන්සේ කිව්වා "ස්වාමීනී මෙ තැන තියෙන දියකඩ පන්සියයක් ගැල් ගිහිල්ලා මඩවෙලා බොරවෙලයි තියෙන්නේ. මීට එහා හොඳ පිරිසිදු වතුර තිබෙන කකුත්ථා නදිය තිබෙනවා. එතැනදී භාග්‍යවතුන් වහන්සේට පැන් වළඳන්න පුළුවන්" කියලා. නමුත් භාග්‍යවතුන් වහන්සේ නැවතත් දෙවනවරටත් "ආනන්ද මට පැන් ටිකක් ගෙනෙන්න, මට පිපාසයි" කිව්වා. දෙවන වරටත් ආනන්ද ස්වාමීන් වහන්සේ අරක කීවා. තුන්වෙනි වරටත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළාට පස්සේ ඒ ගෞලයෙක් වශයෙන් බුදුරජාණන් වහන්සේ තුන්වෙනි වර කීවාට පස්සේ ඒක ප්‍රතික්ෂේප කරන්න බැහැ. ඒක නිසා ආනන්ද ස්වාමීන් වහන්සේ පාත්‍රයක් අරගෙන ඒ දියකඩ ළඟට යනකොට අර බොරවෙලා තිබුන මඩවතුර එහෙමපිටින්ම පැදිලා ප්‍රසන්න ජලය බවට පත්වුනා. ආනන්ද ස්වාමීන්වහන්සේ මේක ආශ්චර්යවත් දෙයක්, මහත් අද්භූත දෙයක්. භාග්‍යවතුන් වහන්සේගේ සෘද්ධි බලය නිසා මේ මඩවුන වතුර පැදුනා කියලා පැන් අරගෙන ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට

පිළිගැන්වූවා. ඉතින් බුදුරජාණන්වහන්සේ ඒ පැන් ටික වළඳලා ඊළඟට පිටත් වෙලා ගියා.

ඊළඟට අපට අහන්න ලැබෙන්නේ කකුත්ථා නදිය ළඟටම පැමිණිලා එතැනදිත් ඒ අසල තිබෙන අඹවනයකට වැඩම කරලා එතනදී බුදුරජාණන් වහන්සේ චුන්දක කියන ස්වාමීන්වහන්සේ නමක්- චුන්දකර්මාරපුත්‍රයා එක්ක කවලම් කරගන්න හොඳ නැහැ. චුන්ද නාමයෙන් හුඟක් අය හිටියා. චුන්දක කියන ඒ ස්වාමීන්වහන්සේට කිව්වා ඒත් අර සිවුර සතරගුණයක් කරලා එලන්න මට ටිකක් සැතපෙන්න ඕන කියලා. ඉතින් බුදුරජාණන් වහන්සේ මඳ වේලාවක් සිංහ සෙය්‍යාවෙන් එතන සැතපිලා ඔන්න නැගිටලා ආනන්ද ස්වාමීන් වහන්සේට කියනවා "ආනන්ද සමහරවිට ඇතැම් කෙනෙක් මගේ පරිනිර්වාණයෙන් පස්සේ"- ඒ වෙනකොට භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරලා ඉවරයි අද රාත්‍රියේ දී මම කුසිනාරාවේදී පරිනිර්වාණයට පත්වෙනවා කියල- ඉතින් ආනන්ද ස්වාමීන්වහන්සේට කියනවා, "මගේ පරිනිර්වාණයෙන් පස්සේ ඇතැම් කෙනෙක් චුන්දකර්මාර පුත්‍රයාට සමහරවිට කුකුසක් පසුතැවිල්ලක් ඇති කරන්න පුළුවන් ඔබේ ආහාරය වළඳලා තමයි භාග්‍යවතුන් වහන්සේ පරිනිර්වාණයට පත්වුනේ කියලා. ඒ තුළින් කුකුසක් පසුතැවිල්ලක් ඇතිකරන්න ඉඩ තිබෙනවා. ඒක නිසා ආනන්ද මෙන්න මෙහෙම ප්‍රකාශ කරන්න. ඇතැම් කෙනෙක් කීවොත් ඒ අය ඔබට කුකුස් උපදවන්නයි කියන්නේ. "ඔබේ නොලැබීමක්, ඔබ විසින් වැරදිලෙස කරපුදෙයක් මෙන්න මේ භාග්‍යවතුන් වහන්සේට මේ විධියේ ආහාරයක් පිරිනැමීම. ඒක වළඳලයි භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑවේ කියලා. ඒ විධියට යම්කෙනෙක් කීවොත් ආනන්ද මෙහෙම කියන්න "නැහැ නැහැ, භාග්‍යවතුන් වහන්සේ කියලා තියෙනවා "සුලද්ධං" හොඳ ලැබීමක් ඔබට ලැබිලා තියෙන්නේ භාග්‍යවතුන් වහන්සේට අවසාන දානය පිළිගන්වන්න ලැබීම'' කියලා. ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ ඒ අවසාන දානයේ ආනිශංස එතැන ප්‍රකාශ කරනවා. තථාගතයන්වහන්සේගේ අභිසම්බෝධියට උපකාරවන යම් දානයක් පිරිනැමුවාද- ඒ මේ පින්වතුන් දන්නවා සුජාතාවගේ කිරිපිඩුදානය- අන්න ඒ වගේම සමඵල සමවිපාක දානයක් තමයි මේ චුන්ද පිරිනමලා තියෙන්නේ. ඒක ධර්මතාව වශයෙන් ප්‍රකාශ කරනවා. යම් ආහාරයක් තථාගතයන්වහන්සේ වළඳලා අවසාන ආහාරය වශයෙන් අභිසම්බෝධියට පත්වෙනවාද ඒ ආහාරය හා සම සමවිපාක, සම ආනිශංස, මහත් ඵල මහානිසංස ඇති ආහාරයක් තමයි උන්වහන්සේගේ පරිනිර්වාණයට හේතුවන, පරිනිර්වාණයට උපකාරවන ඒ අවසාන දානය පිළිගැන්වීම කියලා. ඒ විදියට යම් කිසි කෙනෙක් චුන්ද කර්මාර පුත්‍රයාට දොස් පැවරුවොත් මේ විධියට භාග්‍යවතුන් වහන්සේ හමුවේම මට මේක අහන්න ලැබුනා කියලා කියන්න කියලා බුදුරජාණන් වහන්සේ පැවරුවා.

දැන් එතකොට ඔන්න ඔතෙන්දි අපට හිතාගන්න පුළුවන්- ඉතින් ඇත්ත වශයෙන් ඕක විවාදයට භාජනය වුනු කාරණයක්. අපේ මේ මාතෘකාව තාමත් ඇත. නමුත් කෙටියෙන් සලකා ගන්න තියෙන්නේ කොයි කොයි හැටියෙන් කිව්වත් බොහෝ දෙනාට ප්‍රියමනාප විවරණයක් තමා, අර ඌරුමස් පිළිබඳ කතන්දරය. නමුත් අපට සමහර විට හිතන්න ඉඩ තියෙනවා රසායන ශාස්ත්‍රයේත් අර නමින් සඳහන්වන නිසා අතෙන්ට සූකර මංස කියන්නේ නැතුව අමතර දෙයක් වශයෙනුයි ඒ සූත්‍රයේ සඳහන් වන්නේ. ආහාර පාන වලට අමතරව 'සූකරමද්දවයකුත්' සූදානම් කළයි කියලා. ඉතින් සමහරවිට අපට හිතන්න ඉඩ තියෙනවා බුදුරජාණන් වහන්සේ ඒ අවස්ථාවේ බලවත්සේ රෝගාතුරව ඉන්න නිසා යම්කිසි රසායන ආහාරයක් ඒ චුන්දකර්මාර පුත්‍රයා සූදානම් කරලා පිළිගැන්වූවා කියලා, හිතන්න ඉඩ තියනවා. ඉතින් මොකද කෙනෙකුට අහන්න පුළුවන් එහෙනම් ඒක වැළඳුව නිසා මොකද මේ විරේක වුනේ කියලා. අර යටපත් කරගත්තු රෝගය නිසා සමහර විට නරක් වුන ලේ ආදිය තිබුනා නම් ඒවා විරේකවෙන්න ඇති. අටුවාව තව තවත් විස්තර කරනවා. අර චුන්දකර්මාරපුත්‍රයාට දෝෂයක් පැවරීමේ අදහස දුරුකරන්න වගේ. අටුවාව තෝරනවා ඒ ආහාරය නිසා නොවේ භාග්‍යවතුන් වහන්සේට ඒ රෝගය වැළඳුනේ. ඒ ආහාරය කුමක් හෝ වේවා ඒ ආහාරය වැළඳීම නිසා භාග්‍යවතුන් වහන්සේට ඒ තරම් දුරක් පයින් වැඩමකරන්න ශක්තිය ඇතිවුනා කියලා. ඒක නිසා පරිනිර්වාණය සිදුවුනා කියා සිතිය යුතු නැත කියලා. ඒ විධියටත් තෝරනවා. කොයිහැටි හෝ වේවා අපට සිතා ගන්න තියෙන්නේ අරවිධියට ඌරුමස් පූජාවට වඩා බුදුරජාණන් වහන්සේට පහසුව සලසන අදහසින් ඒ වගේ රෝගී අවස්ථාවක විශේෂ රසායනයක් පූජාකරන්න ඇති. ඒ රසායන ශක්තිය තුළින් කායිකපහසුව සලසන්න උපකාරවන අන්දමට විරේචනයකුත් ඒ එක්ක යන්න ඇති.

ඉතින් දැන් ඉදිරියට මීළඟට දැන් මාතෘකාවට අදාල කොටසට එමු... මේ ගාථාදෙකට හේතුවුන ප්‍රවෘත්තිය අර අපි ප්‍රකාශ කළ ආකාරයට සූත්‍රනිපාත කියන ධර්ම ග්‍රන්ථයේ ඔය ගාථා සඳහන් වෙන්නේ- මහා පරිනිර්වාණ සූත්‍රයේ නොවෙයි. ඒකේ අටුවාවේ මෙහෙම කියවෙනවා, මේකට නිදාන කථාව හැටියට. මේ චුන්දකර්මාර පුත්‍රයා කියලා කියන්නේ රන්කරුවෙක්. බොහොම ධනවත් ස්වර්ණාභරණ නිපදවන ස්වර්ණාභරණ වෙළෙන්දෙක් කියලා හිතාගනිමු. එතකොට ඒ නිසා තමන්ගේ ශ්‍රද්ධාව වැඩිකමට මේ චුන්දකර්මාර පුත්‍රයා ඒ දානය පූජාකරන අවස්ථාවේ ආහාර සූපව්‍යංඤ්ජන ආදිය රත්රන් භාජනවල දමලා සංඝයා වහන්සේට පූජාකරලා තියෙනවා. සමහර සංඝයා වහන්සේලා ඒව පරිහරණය කරලා නැහැ. කුතුස උපදවාගෙන රත්රන් භාජන පිළිබඳව. නමුත් ඇතැම් සංඝයා වහන්සේලා ඒවායින් ප්‍රයෝජන අරගෙන තිබෙනවා. ඉතින් තමතමන්ගේ පාත්‍රවල තමයි වළඳන්න ඇත්තේ.

නමුත් අර විශේෂ දේවල් රත්රන් භාජනවල පූජාකරලා තිබෙනවා, ඉතින් අටුවාවේ කියන හැටියට මේ දාන කටයුතු අවසාන උනාට පස්සේ චුන්දකර්මාර පුත්‍රයාත් අත එහෙම සෝදාගෙන බණ අහන්න සූදානම් වෙනකොට චුන්දකර්මාර පුත්‍රයාට පෙනිලා තියෙනවා එක්තරා පාපභික්ෂුවක් - අර- එක - රත් රන් - භාජනයක් - අරගෙන- තමන්ගේ යතුරු එහෙම දාන මල්ල ඇතුළට දානවා. දුටුව නමුත් ඒ චුන්දකර්මාර පුත්‍රයා තුළ තියෙන ශ්‍රද්ධාව නිසා, ඥානවන්ත බව නිසා කල්පනා කළා මේ අවස්ථාවේ මේ හොරකම මම හෙළිකළොත් මේක තුළින් භාග්‍යවතුන්වහන්සේටත් ඒ සීලවන්තසංඝයා වහන්සේලාටත් ලොකු අපකීර්තියක් ඇතිවෙනවාය. ඒ වගේම මිථ්‍යාදෘෂ්ටිකයින්ටත් අවසරයක් ලැබෙනවා ශාසනයට පහර ගහන්න කියලා කල්පනා කරලා ඒක ප්‍රකාශ කළේ නැතෙයි නමුත්, සැකයක් ඇතිවුනයි මේ වගේ අයත් ශ්‍රමණයන්ද කියලා. අන්න ඒ සැකය නැතිකර ගන්නය මෙන්න මේ විධියට සවස්වරුවේ ගිහිල්ලා භාග්‍යවතුන් වහන්සේ හමුවෙලා මේ සූත්‍ර දේශනාවට අදාලවුනු මේ ප්‍රශ්නය විමසුවේ කියලා.

ඔන්න දැන් අපි ඒ ගාථාවේ අර්ථයට එමු. අර්ථය මොකක්ද කියලා තේරුම් ගන්න බලමු. 'පුච්ඡාමි මුනිං පහූතපඤ්ඤං' දැන් පැරණි ගාථාවල- ඒ සූත්‍රනිපාතයේ ස්වභාවයක් තියෙනවා සංවාදවල දෙබස් වශයෙන් තියෙන ඒවායේ ප්‍රකාශ කළ කෙනාගේ නමත් ඇතුල්කරනවා ගාථාවට. අපි ඒක අගටයි දාන්න ඕන. අහවලා කිව්වා කියන එක සමහර විට පළමුවෙනි පදේට පස්සේ තියෙනවා. ඒකයි, 'පුච්ඡාමි මුනිං පහූතපඤ්ඤං' ඉති චුන්දොකම්මාරපුත්තො කියන්නේ. 'ඉති චුන්දොකම්මාරපුත්තො. අර සංගීතිකාරක සංඝයා වහන්සේලා විසින් ඇතුල්කරපු පාඨයක්. මේ කියන්නේ චුන්දකම්මාරපුත්‍රයාය කියන එක පෙන්වන්න. මොකක්ද ඇහුවේ එතකොට. බුදුරජාණන් වහන්සේගෙන් අහනවා 'පහූතපඤ්ඤං' කියන්නේ විපුලවූ ප්‍රඥාව ඇති, මහත්වූ ප්‍රඥාව ඇති, මුනිවරයාගෙන් මම මේ අසනවා. ඊළඟට බුදුරජාණන් වහන්සේටම විශේෂණ පද කීපයක් ඊළඟට තියෙන්නේ. 'බුද්ධං ධම්මස්සාමිං වීතතණ්හං' ධර්මස්වාමි වූ, තෘෂ්ණාව දුරුකළා වූ ඒ වගේම 'දිපදුත්තමං' කියන්නේ දෙපා ඇත්තන් අතර උතුම් වූ 'සාරථීනං පවරං' - රියැදුරන් අතර ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේගෙන් මේ ප්‍රශ්නය අසනවා කියලා ඔන්න ඊළඟට ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. 'කති ලොකෙ සමණා තදිඞ්ඝ බ්‍රෑහි' ලෝකේ ශ්‍රමණයෝ කීදෙනෙක් ඉන්නවද? කරුණාකර, මට සමාවෙලා, ඒක මට කියාදෙන්න කියලා ඔන්න චුන්ද ප්‍රශ්නය ඉදිරිපත් කළා ඒ ගාථාවෙන්.

ඔන්න ඒකට බුදුරජාණන් වහන්සේ දෙන පළමුවෙනි පිළිතුරු ගාථාව 'චතුරො සමණා න පඤ්චමොත්ථි චුන්දාති භගවා' අන්න එතනත් 'චුන්දාති භගවා' කියන එක සංගීති කාරක සංඝයාවහන්සේලා ඇතුල් කළ පාඨයක්. මේ භාග්‍යවතුන් වහන්සේයි මේ උත්තර දෙන්නේ කියන එක. මොකක්ද

එතකොට පළමුවැනි පදයෙන් කියවෙන්නේ. 'චතුරො සමණා න පඤ්චමොත්ථි' ශ්‍රමණයෝ හතර දෙනයි ඉන්නේ. පස්වැන්නෙක් නැත, යනුවෙන් භාග්‍යවතුන්වහන්සේ පිළිතුරු දෙනවා 'තෙ තෙ ආවිකරොමි සක්ඛිපුට්ඨො' මා ඉදිරියේ මේ ප්‍රශ්න කළා වූ ඔබට ඒ අය මම පැහැදිලි කරලා දෙන්නම්. 'තෙ තෙ ආවිකරොමි'. ඔන්න ඊළඟට හතරදෙනා කියනවා. 'මග්ගජිනො, මග්ගදෙසකො, යොච මග්ගෙ ජීවති, යො ච මග්ගදූසී. පළමු වෙනි එක්කෙනා 'මග්ගජිනො'. දෙවෙනි ශ්‍රමණයා 'මග්ගදෙසකො'. තුන්වෙනි ශ්‍රමණයා 'මග්ගජීවී' මාර්ගයෙහි ජීවත්වන තැනැත්තා. හතරවෙනි ශ්‍රමණයා 'මග්ගදූසී' මාර්ගය දූෂණය කරන තැනැත්තා. එතකොට මග්ගජිනො, මග්ගදෙසකො, මග්ගජීවී- මග්ගජීවී හෝ මග්ගජීවකො ඒ දෙකම යෙදෙනවා එතන- මග්ගදූසී.

ඉතින් ඊළඟට එන ගාථාවලින් මේ හතරදෙනා බුදුරජාණන් වහන්සේ විග්‍රහකරනවා. එක් එක් ගාථා නැතත් ඒවායේ සාමාන්‍ය අර්ථය අපි මෙතැනදී ප්‍රකාශ කරනවා. මග්ගජිනො කියන එක තේරුම් ගන්න පහසුයි. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා තමන්වහන්සේම ගැන. මේ නිර්වාණයට - කවුරුත් දන්නවා- මාර්ගය සොයා ගත්තේ භාග්‍යවතුන් වහන්සේ බව. අතීත බුදුවරුන්ගෙන් ඇතිවුන බුද්ධශාසනය නැතිවුනාට පස්සේ- ඇතැම් තැන්වල දක්වනවා-ඔය යම්කිසි නගරයකට යනපාර වල්වැහිලා කාලයක් වල්බිහිවෙලා තිබුන මාර්ගයක් මේ බුදුරජාණන් වහන්සේ සොයාගත්තා. ඒ අර්ථයෙන් එතකොට ඒ නිර්වාණ මාර්ගය, ආර්ය අෂ්ටාංගිකමාර්ගය, සත්තිස්බෝධිපාක්ෂික ධර්ම, ඒවා භාග්‍යවතුන් වහන්සේ හෙළිකරගත්තු නිසා පළමුවෙන්ම අන්න 'මග්ගජිනො'. එතකොට ඒ ගාථාවේ සාමාන්‍ය අදහස භාග්‍යවතුන් වහන්සේ තමයි, බුදුරජාණන් වහන්සේ තමයි 'මග්ගජිනො' මාර්ගය ජයගත්තු තැනැත්තා- මාර්ගය සොයා ගත්තු තැනැත්තා.

දෙවෙනි ශ්‍රමණයා 'මග්ගදෙසී' ඒ ශ්‍රමණය ගැන සඳහන් වන්නේ 'පරමං පරමන්ති යොධ ඤත්වා ලොකෙ' මේ ලෝකයේ උතුම්වූ නිර්වාණය උතුම් හැටියටම ප්‍රත්‍යක්ෂයෙන් දැනගෙන - **ප්‍රත්‍යක්ෂයෙන් දැනගෙන**- ඒ රහතන්වහන්සේ ගැනයි කියන්නේ. ඒ ධර්මය ඊළඟට ඒක දේශනා කරනවා, ඒක විභාගකරලා දක්වනවා. දැන් ඔය පින්වතුන් අහලා තියනවා පටිසම්භිදා ශක්තීන්. ඒ විධියේ ඒව යොදලා ධර්මය අනික් අයට තේරුම්කරලා දෙනවා. අනික් අයගේ ඒ ධර්මය පිළිබඳව සැකදුරලනවා. අන්න එබඳු භික්ෂුව තමයි 'මග්ගදෙසී' කියන්නේ. ඒ කියන්නේ රහතන්වහන්සේ. ඒවා හොඳට ප්‍රත්‍යක්ෂ කරගෙන භය නැතිව ඒ ධර්මකාරණා පැහැදිලි කරලා දෙන දෙවෙනි ශ්‍රමණයා- මග්ගදෙසී, මග්ගදෙසකො කියලත් කියනවා.

ඊළඟට තුන්වැනියා තමයි 'මග්ගජීවි'. ඒ කියන්නේ ධර්මයේ හරියාකාරව- ධර්මමාර්ගයේ - සුදේසිත ධර්ම මාර්ගයේ- හරියාකාරව හික්මෙන තැනැත්තා. එතන අටුවාවල තෝරන්නේ දැන් මේ පින්වතුන් සමහරවිට අහල ඇති ඔය ආර්ය පුද්ගලයින් ගැන කියන කොට සේඛ අසේඛ කියලා වචන දෙකක්

යෙදෙනවා. අසේඛ කියන්නේ හික්මීම අවසන් කළ රහතන් වහන්සේ හැඳින්වීමටයි. සේඛ කියලා කියන්නේ තවම රහත්බවට පත්නොවූ සෝවාන් ඉඳලා අනාගාමි දක්වා සිටින අනිකුත් ආර්යයන් වහන්සේලායි. ඉතින් මෙතන මේ තුන්වෙනුවට මේ කියන්නේ- දැන් බුදුරජාණන්වහන්සේ පළමුවෙන් කිව්වා. දෙවනුව කිව්වේ රහතන් වහන්සේ ගැන - තුන්වෙනුව කියන්නේ අන්න ඒ සේඛ භික්ෂූන් වහන්සේලා - ඒ කියන්නේ ආර්ය තත්ත්වයට පැමිණි සෝවාන් සිට අනාගාමී වූ, මාර්ගයේ තවමත් හික්මෙන්නා වූ, නියම ප්‍රතිපදාවේ හැසිරෙන්නාවූ, ඒ සංඝයාවහන්සේලාත් ඊට අමතරව දක්වනවා කළ්‍යාණපුථුජ්ජන හොඳ ශීලාදී ගුණධර්ම වලින් පරිපූර්ණ මාර්ගඵල නොලැබූ නමුත්, හොඳ ප්‍රතිපත්තිගරුක සංඝයා වහන්සේලා තුන්වෙනි ගාථාවෙන් හැඳින්වෙනවා.

ඔන්න හතරවෙනුව තමයි ඊළඟට දක්වෙන්නේ අන්න අර කියාපු 'මග්ගදූසී' කියන එක. මාර්ගය දූෂණය කරන භික්ෂුව පිළිබඳව. ඉතින් එතෙන්දි හඟවනවා ප්‍රතිපත්ති ගරුක සංඝයාවහන්සේලාගේ ඒ ස්වරූපය ඇතිව හැසිරෙන-ඒ කියන්නේ භික්ෂුවකගේ ස්වරූපය එහෙම නැත්නම් රහතන්වහන්සේලාගේ ස්වරූපය අරගෙන හැසිරෙන නමුත්, ඔන්න ඊළඟට පද කීපයක් දක්වනවා ඒ මග්ගදූසී භික්ෂුවගේ ස්වභාවය පෙන්නුම් කරන්න. ඒ භික්ෂුව පිළිබඳව දක්වනවා. 'පගබ්භී', ප්‍රගල්භය, පගබ්භී පක්ඛන්දී ඊළඟට 'කුලදූසකො' ඔය විධියට වචන කීපයක් දක්වනවා. පක්ඛන්දී කියල කියන්නේ සභාපිරිස් මැදට කඩාපනින. තමන්ට මෙච්චර වස් තියනවා කියල ඒ වස් ගණනින් ඉදිරියට පනින. ඒ විධියටයි අටුවාවෙ තෝරන්නේ. ඊළඟට 'කුලදූසකො' කුලදූෂණය කරනවා කියල කියන්නේ ගිහිපින්වතුන්ගේ ශ්‍රද්ධාව දූෂණය වන අන්දමේ කටයුතුවල යෙදෙනවා. ඊළඟට පගබ්භො කියල කියන්නේ කයින් වචනයෙන් දඬබ්බර. දඬබ්බර අන්දමේ කායික වාචසික පැවතුම් ඇතිවීම පගබ්භො. ඊළඟට තව වචනයක් යොදනවා 'පලාපො'. පලාපො කියන වචනයේ තේරුම දැන් ඔය වී ඇට අතරෙ තියනවා සමහර බොල්. බැලුවාම ඇතුලේ හාල් ඇටයක් තියනවා කියලා රැවටෙනවා. නමුත් හාල් ඇටයක් නැහැ, අන්න පලාප කියන්නේ බොල් වී. එතකොට බොල් කියන අදහස. ඔන්න ඔයවිධියේ වචන රාශියක් එතන බුදුරජාණන් වහන්සේ යොදනවා. ඒවගේම ඒ විධියේ පැවතුම් නිසා 'ප්‍රතිරූපී' සංඝයා වහන්සේලාගේ ස්වරූපය- 'සමණ ප්‍රතිරූපක' කියලා කියන්නේ. ඒ ස්වරූපයෙන් හැසිරෙන තැනැත්තාට තමයි 'මග්ගදූසී' කියලා කියන්නේ. අර මාර්ගය දූෂණය කරන.

ඔන්න හතරදෙනා දක්වලා ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා තවත් වැදගත් කාරණයක්. මේ හතරදෙනා හරියාකාරව තේරුම් ගත්තු ඥානවන්ත ආර්යශ්‍රාවක ගෘහස්ථයා කල්පනා කරනවා 'සබ්බෙ නෙතාදිසොති ඤත්වා', හැමදෙනාම මෙහෙම නොවෙයි කියලා කල්පනා කරලා, තමන්ගේ ශ්‍රද්ධාව නැතිකර ගන්නේ නැහැ. තමන්ගේ ශ්‍රද්ධාව නැතිකරගන්නේ නැහැ. කොහොමද

අර දූෂිත තැනැත්තත් අදූෂිත තැනැත්තත්- පිරිසිදු තැනැත්තත් අපිරිසිදු තැනැත්තත්- කොහොමද සමකරන්නේ කියලා ඒ විධියටයි බුදුරජාණන් වහන්සේ ඒ දේශනාව අවසාන කරන්නේ චුන්දකර්මාර පුත්‍රයාගේ සැකය දුරලීමට.

ඉතින් ඔන්න ඔය කතන්තරයයි අප ඉදිරියේ තියෙන්නේ මේ ගාථාවලින් ඉදිරිපත් කරලා තියෙන එක. ඉතින් මෙන්න මේකට අදාලව තව ටිකක් කාරණා මෙතන විශේෂයෙන් අපට කියන්න වෙන්නේ අර ශ්‍රමණ පදය පිළිබඳවයි.

අපි කලින් සඳහන් කළ ආකාරයට සමාජයේ පැවතුන ශ්‍රමණ කියන පදය බුදුරජාණන් වහන්සේත් සංඝයාවහන්සේලාත් වෙනුවෙනුත් ව්‍යවහාරවුන නිසා ඇත්ත වශයෙන්ම බුදුරජාණන් වහන්සේට පෙන්වන්න සිද්ධවුනා, ලෝකයාට කියාදෙන්න සිද්ධවුනා ඒ විධියේ එතෙක් තිබුන ශ්‍රමණ සංකල්පය නොවෙයි අපි මේ ඉදිරිපත් කරන්නේ කියන එක. ඉතින් ඒක තමයි ඇතැම් අවස්ථාවල දැන් මේ පින්වතුන් සමහරවිට අහලත් ඇති ඔය චූලසීහනාද සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ කළ එක් සීහනාදයක් තමයි- සූත්‍රය ආරම්භවන්නේ - භික්ෂූන් වහන්සේලා අමතලා කියනවා '**ඉධෙව භික්ඛවෙ සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො, ඉධ චතුත්ථො සමණො. සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙති එවමෙතං භික්ඛවෙ සම්මා සීහනාදං නදථ**'. ඒක මහා පුදුම විධියේ සිංහනාදයක් එතන බුදුරජාණන් වහන්සේ කරන්නේ. මෙහේමයි, මේ ශාසනයේමයි, නියම ශ්‍රමණයා ඉන්නේ. මේ සාසනේමයි දෙවෙනි ශ්‍රමණයත් තුන්වෙනි ශ්‍රමණයත්, හතරවෙනි ශ්‍රමණයත්. අනිකුත් සාසන හැම එකක්ම ශ්‍රමණයන්ගෙන් ශූන්‍යයි කියල මේ විධියට පරප්පවාද කියල කියන්නේ අනික් තීර්ථක ආගම් ආදී තීර්ථක ආයතන හැම එකක්ම නියම ශ්‍රමණයන්ගෙන් හිස්ය කියලා. මේ විධියට සිංහනාද නගව් කියල නාදකරන්න කියලා සංඝයා වහන්සේලාට ප්‍රකාශකරපු අවස්ථාවක් තිබෙනවා.

ඒ එක්කම ඇතැම් අවස්ථාවල සංඝයාවහන්සේලාට තවත් හිත් කාවදින අන්දමට මේ ශ්‍රමණ කියන වචනයට අදාලවන බුදුරජාණන් වහන්සේගේ තවත් ඒ විධියේ සූත්‍රයක් ගත්තොත්- බුදුරජාණන්වහන්සේ මෙහෙම ප්‍රකාශ කරනවා"මහණෙනි,මම කියනවා යම්කිසි ශ්‍රමණයෙක් ලෝකයේ ආස්වාදපක්ෂය, ආස්වාද වශයෙනුත්, ආදීනව පක්ෂය ආදීනව වශයෙනුත්, නිස්සරණය නිස්සරණය වශයෙනුත්, තේරුම් නොගත්තු යම් ශ්‍රමණ- බ්‍රාහ්මණයින් සිටිනවා නම් ඒ අය ඇත්ත වශයෙන් ශ්‍රමණබ්‍රාහ්මණයින් නොවේ. ඒ අය ශ්‍රමණබ්‍රාහ්මණ තත්ත්වයේ අර්ථය හරියට තේරුම් ගත්තු අය නොවේ. එයින් පෙන්නුම් කරන්නේ එතකොට ශ්‍රමණයෙකුට අයිති දෙයක් තමයි ආස්වාද පක්ෂය ආස්වාද හැටියටත්- ලෝකයේ ආස්වාද පක්ෂය ආස්වාද හැටියටත්- ඒවායේ ආදීනව, ආදීනව හැටියටත් ඒවායින් නිස්සරණය හරියාකාරව නිස්සරණය හැටියටත් අවබෝධ කරගැනීම, ප්‍රත්‍යක්ෂ කරගැනීම, ශ්‍රමණයෙකුගේ කෘත්‍යයක් හැටියට.

මේ ශ්‍රමණ කෘත්‍යය ගැන කියනකොට අපට තවත් ඒ වගේම වැදගත් සූත්‍රයක් සිහියට නැගෙනවා. එක් අවස්ථාවක බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කරනවා"මහණෙනි, ශ්‍රමණයන්ට තියෙන - එතැන කියන්නේ 'සමණ කරණීයානි' ශ්‍රමණයන්ට තියෙන කෘත්‍ය, ශ්‍රමණ කෘත්‍ය මොනවාද කියලා බුදුරජාණන් වහන්සේ එතන ප්‍රකාශ කරනවා. ශ්‍රමණයකු හැටියට කල්පනාකරන කොට දන් සමහර විට නානාවිධ '**කාර්ය භාරයන්**' ලෝකයේ කෙනෙක් දක්වන්න පුළුවන්. නමුත් බුදුරජාණන්වහන්සේ ප්‍රකාශකරන්නේ ඒක නොවෙයි. මෙන්න මේ ශ්‍රමණභාවයට උපකාරවන කාරණයි. මොනවද? සීල, සමාධි, පඤ්ඤා- ඒ සූත්‍රයේ දක්වන්නේ. අධිසීල, අධිචිත්ත, අධිපඤ්ඤා කියන වචන තුන යෙදෙනවා. මේ පින්වතුන් අහලත් ඇති අධිසීල කියල කියන්නේ මාර්ග ඵල අවබෝධයට උපකාරවන උතුම් ඒ සීලය. අධිචිත්ත කියලා කියන්නේ සමාධිය. අධිපඤ්ඤා කියලා කියන්නේ විපස්සනා භාවනාමය ප්‍රඥාව. ඉතින් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශකරනවා ශ්‍රමණයකුට අයිති ශ්‍රමණකෘත්‍ය තුනක් තිබෙනවා, මොනවද? අධිසීලයෙහි හික්මීම. ඒ පිළිබඳව දැඩි ඕනෑකමක් 'තිබ්බො ඡන්දො' කියන වචනය තියෙනවා. කෙනෙකුට වැරදි හැඟීම් ඇතිවන වචනයක් එතැන යොදන්න වෙලා තියෙනවා. 'තිබ්බො ඡන්දො' කියලා කියන්නේ තීව්‍ර '**ඡන්දයක්**', තියුණු ඡන්දයක්. එතකොට තියුණු '**ඡන්දයක්**' ඇතිකරගන්න ඕනෑ. ඒ කියන්නේ දැඩි ඕනෑකමක් ඇතිකරගන්න ඕන. නියම ශ්‍රමණයෙක් නම් අර අධිසීල ශික්ෂාව පිළිබඳව. ඒ වගේම තියුණු **ඡන්දයක්** ඇතිකරගන්න ඕනෑ අධිචිත්තය පිළිබඳව. තියුණු **ඡන්දයක්** ඇතිකරගන්න ඕනෑ අධිපඤ්ඤාව පිළිබඳව.ඒක තමයි සංඝයාවහන්සේලාට අයිති.

එහෙම දක්වලා බුදුරජාණන් වහන්සේ පුදුම අන්දමේ සියුම් උපහාසයක් නැගෙන උපමාවක් ඊළඟට ඉදිරිපත් කරනවා. මහණෙනි, ඔය ඇතැම්විට කොටළුවෙක් ගවරැළක් පිටි පස්සෙන් පිටිපස්සෙන් යනවා. මමත් ඔයගොල්ලන්ගේ කෙනෙක් කියමින්, එතන මහ පුදුමදෙයක්. ඒ දක්වන්නේ පාලි වචනය තියෙනව '**අහම්පි අම්හා, අහම්පි අම්හා**' ඇත්ත වශයෙන් කොටළුවාගේ ශබ්දය හැටියට වගේ එතන බුදුරජාණන් වහන්සේ දාලා තියෙන්නේ නමුත් නිරර්ථක වචන දෙකක් නොවේ 'අහං' කියන්නේ මම. අම්හා කියන්නේ බහුවචන ක්‍රියාපදයක්. 'අහම්පි අම්හා, අහම්පි අම්හා' කිය කියා මේ කොටළුවා අර ගවරැළ පිටිපස්සේ යනවා. ඒකේ අදහස 'මමත් ඔයගොල්ලන්ගෙම කෙනෙක්,' 'මමත් ඔය ගොල්ලන්ගෙම කෙනෙක්'. එහෙම කිව්වාට මොකද මහණෙනි, ඒ කොටළුවාට ගවයින්ගේ වර්ණයත් නැහැ. ඒ ගවයින්ගේ පාටත් නොවේ කොටළුවාගේ. ගවයින්ගේ ස්වරයත් නැහැ ගවයින්ගේ කටහඬත් නැහැ. ඊළඟට ගවයින් පා තියන හැටියටත් නොවේ කොටළුවා පා තබන්නේ. 'ගවයින්ගේ පද' කියලා කියන්නේ ගවයින් පා තබන ආකාරයටත් නොවේ කොටළුවා පා තබන්නේ. නමුත් කොටළුවා ගවයින් පිටිපස්සේ යනවා '**අහම්පි අම්හා, අහම්පි අම්හා**' කිය කියා. ඔහොම කියලා බුදුරජාණන්

වහන්සේ ප්‍රකාශ කරනවා."එසේම මහණෙනි මේ ශාසනයේ ඇතැම් භික්ෂුවක් භික්ෂුසංඝයාගේ පිටිපස්සෙන් යනවා. 'අහම්පි භික්ඛු, අහම්පි භික්ඛු' මමත් භික්ෂුවක් මමත් භික්ෂුවක් කියමින්. නමුත් ඒ භික්ෂුව තුළ අර කියාපු අධිසීල ශික්ෂාව පිළිබඳව තීව්‍ර ඡන්දයක් නැහැ, අධි චිත්ත ශික්ෂාව පිළිබඳව තීව්‍ර ඡන්දයක් නැහැ. අධිපඤ්ඤා ශික්ෂාව පිළිබඳවත් තීව්‍ර ඡන්දයක් නැහැ, කියලා ඔන්න ඔය විධියටයි සූත්‍රය ඉදිරිපත් කරන්නේ බුදුරජාණන්වහන්සේ. ඒක නිසා මහණෙනි මේ විධියට හික්මිය යුතුයි. අප විසින් දැඩි ඡන්දයක්, දැඩි ඕනෑකමක්, දැඩිකැමැත්තක්, බලවත් කැමැත්තක් ඇතිකරගත යුතුයි අධිසීල ශික්ෂා සමාදානය පිළිබඳව, අධිචිත්ත ශික්ෂාසමාදානය පිළිබඳව, අධිපඤ්ඤා ශික්ෂා සමාදානය පිළිබඳව. ඔන්න ඔය විධියේ සූත්‍රයකුත් තියෙනවා. ඉතින් ඒකත් අර ශ්‍රමණ කෘත්‍යය තේරුම් ගැනීමට උපකාර වෙනවා. ශ්‍රමණයෙකුගේ '**කාර්යභාරය**' - මේ කාලයේ හැටියට කියනවා නම්-. ශ්‍රමණයෙකුගේ '**කාර්යභාරය**' මොකක්ද කියන එක බුදුරජාණන් වහන්සේගේ වචනයෙන්.

ඊළඟට තවත් වටිනා සූත්‍රයක් තියෙනවා ඒ සූත්‍රයේ නමෙන් පවා ශ්‍රමණ කියන වචනය කියවෙන්නේ. ඒක අනියම්ව යෙදෙන්නේ. සමණමණ්ඩිකා සූත්‍රය කියලා සූත්‍රයක්. එතනත් හොඳ සිද්ධියක් සඳහන් වෙනවා. බුදුරජාණන් වහන්සේ ශ්‍රමණයෙකු පිළිබඳ ශ්‍රමණයෙකුගේ පරමාර්ථය කුමක් විය යුතුද? ප්‍රතිපදාව කුමක් විය යුතුද? කියන එක ගැන ඉතාම දීර්ඝ විස්තරයක් කරනවා. බොහොම ගැඹුරු සූත්‍රයක් ඒක ඇත්තවශයෙන්. ඒක අපි අවස්ථානුකූලව කෙටියෙන් දක්වන්න උත්සාහ කරනවා. ඒක ආරම්භ වන්නේ මෙන්න මේ විධියටයි. ඒ සැවැත් නුවර මල්ලිකාරාමය කියලා එකක් තිබුණා. මල්ලිකාදේවිය නානාවිධ තීර්ථකයන්ට එකතුවෙලා සාකච්ඡා කරන්න හදලා දීපු ශාලාවක් මල්ලිකාරාමය. ඉතින් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වැඩවාසය කරන අවස්ථාවක සමණමණ්ඩිකාපුත්ත උග්ගාහමාන කියන පරිබ්‍රාජකයා විශාල පරිබ්‍රාජකයින් පිරිසක් එක්ක මෙන්න මේ මල්ලිකාරාමයේ වාසය කළා. ඉතින් බොහෝ අවස්ථාවල අපේ පොත්වල සඳහන් වෙන්නේ පරිබ්‍රාජක පිරිස්වල අසංවරකම පෙන්වන්න වගේ, ඒ අය නානාවිධ තිරශ්චීන කථාවල යෙදෙමින් කෑකෝගසමින් සිටියයි. බුදුරජාණන් වහන්සේ පමණක් නොවේ. සංඝයාවහන්සේලා හෝ බෞද්ධ උපාසක කෙනෙක් හෝ එනකොට අර පිරිස් 'නිහඬවෙන්න නිහඬවෙන්න' කියලා සංවර කරනවයි කියලා සඳහන් වෙනවා. දන් මෙතනත් ඔන්න එතකොට එහෙම අවස්ථාවක්. ඒ සැවැත්නුවර හිටියා බොහොම ශ්‍රද්ධාවන්ත වඩුමහත්මයෙක් පංචකංග කියලා- සමහර විට උපකරණ පහක් නිරන්තරයෙන් භාවිතා කළ නිසා වෙන්න ඇති- පංචකංග කියන සැදැහැවත් වඩුමහත්මයා එක් දවසක් දවල් කාලයේ කල්පනා කළා මම භාග්‍යවතුන්වහන්සේ දකින්න යන්න ඕන කියලා. පිටත්වුනා. පිටත් වුනාට මොකද පස්සෙ මතක්වුනා මේ මද්දහන වෙලාවේ භාග්‍යවතුන් වහන්සේත් සංඝයාවහන්සේලාත් විවේකයෙන් භාවනාවේ වැඩසිටිනවා ඇති. ඒක නිසා

මම ටිකක් පරක්කුවෙලා යන්න ඕන. මේ ටිකට අර මල්ලිකාරාමයේ තීර්ථකයින් හමුවෙලා ටිකක් සාකච්ඡා කරලා යන්න ඕන කියලා එතෙන්ට පැමිණියා.

එතනට ගියාම ඇතදීම දකලා අර පිරිස නිහඬකරලා උග්ගාහමාන පරිබ්‍රාජකයා මේ අපේ පංචකංග බාස්උන්නැහේ, වඩුබාස්සුන්නැහෙ, එහෙම නැත්නම් මේ කාලයේ හැටියට කියනවා නම් වඩුමහත්මයා, ඉඳගත්තාට පස්සේ තමන්ගේ මතයක් ප්‍රකාශ කරනවා ප්‍රතිචාරයක් බලාපොරොත්තුවෙන් වගේ. "මම කියනවා යම්කෙනෙක් කයින් පාපකර්මයක් කරන්නේ නැත්නම්, වචනයෙන් පාපී වචනයක් ප්‍රකාශ කරන්නේ නැත්නම්, පාපී සිතුවිල්ලක් සිතන්නේ නැත්නම්, පාපී ආජීවයක්- ජීවිකාවක්- පවත්වන්නේ නැත්නම් ඒ තැනැත්තාට මම කියනව උතුම්ම ශ්‍රමණ භාවයෙන් සම්පන්න, පරමකුසල සම්පන්න, උතුම්ම කුසලයකින් සම්පන්න වූ, උතුම් වූ තත්ත්වයට පත්වූ, වාදයකින් නොපැරදවිය හැකි, 'අයොජ්ඣ' කියල කියනවා, යුද්ධ කරලා- ඒ කියන්නේ වාද යුද්ධයකින් නොපැරදවිය හැකි උතුම් ශ්‍රමණයෙක් කියල මම කියනවා කියල ප්‍රකාශයක් කළා. ප්‍රකාශයක් කළාම මේ පංචකංග වඩුමහත්මයා කල්පනාවේ වැටුනා මේ කියන එක හරිද කියල. නමුත් උත්තරයක් දුන්නේ නැහැ. මේක පිළිගත්තෙත් නැතිව පංචකංග වඩුමහත්මයා නැගිටලා භාග්‍යවතුන් වහන්සේ ළඟට ගිහිල්ලා මේ සිද්ධිය ප්‍රකාශ කළා. මේ පරිබ්‍රාජකයා කියාපු එක.

ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා- 'ථපති' -ඒ කියන්නේ වඩුමහත්මයා අමතන හැටි. පංචකංගට ප්‍රකාශ කරනවා ඔය උග්ගාහමාන පරිබ්‍රාජකයා කියන කාරණය ඇත්ත නම් උඩුබැලිව නිදන ලාබාල ළදරුවත් ලෝකයේ උතුම්ම තත්ත්වයට පැමිණි ශ්‍රමණයෙක්ය. මොකද උඩුබැලිව නිදන ලාබාල ළදරුවාට කය කියන හැඟීමක්වත් නැත. ඉතින් කොහොමද කයින් පාපකර්ම කරන්නේ- දඟලීම හැරෙන්න. පොඩි දරුවෙකුගෙ දඟලීම හැරෙන්න වෙන දෙයක් නෑ නෙ. ඒ වගේම උඩුබැලිව නිදන ළදරුවෙක් වචනය කියන්නෙ මොකක්ද කියලවත් දන්නෙ නැහැ. තවම බහතෝරන්නවත් දන්නේ නැහැ නේ? ඉතින් කොහොමද නරකවචන කතාකරන්නේ- හැඬීම ඇරෙන්න. අඬන එක තමයි ළදරුවාගේ භාෂාව. ඊළඟට බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කරනවා උඩුබැලිව නිදන ළදරුවාට සංකල්ප කියල කියන්න තරම් හිතුවිල්ලක් කියල දේකුත් නැහැ. සිනාසීම ඇරෙන්න. දන් පොඩි දරුවෝ හේතුවක් නැතිවත් හිනාවෙනවා නේ. අන්න ඒ වගේ හිනාවීම තුළින් ඇතුළෙ තියන යම්කිසි සංකල්පයක් අපි දැනගන්නවා. ඒ ඇරෙන්න වෙන සංකල්ප වශයෙන් හිතීමේ ශක්තියක් ඒ ළදරුවාට නැහැ. ඊළඟට හතරවෙනුව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා උඩුබැලිව නිදන ලාබාල ළදරුවාට ආජීවයක් කියල වෙන අමුතු ජීවිකාවක් නැහැ- මව්කිරි බීම ඇරෙන්න. මව්කිරි බීම තමයි 'රස්සාව'. එහෙම නම් ඔය උග්ගාහමාන පරිබ්‍රාජකයා කියන හැටියට

ඒ උඩුබැලිව නිදන ළදරුවත් අර කියන වාද යුද්ධයකින් පැරදවිය නොහැකි මහා ශ්‍රමණයෙක්.

ඔන්න ඊළඟට බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කරනවා ඒ වෙනුවට නියම ශ්‍රමණයෙක් වෙන හැටි. ඒ ප්‍රතිපදාව බොහොම සවිස්තරව දක්වනවා. මෙතනදී ඒවා ඔක්කොම කියන්න ගියොත් මේ පින්වතුන්ට ඒවා අල්ලගන්න අමාරු වෙන්නත් පුළුවන්. නමුත් ප්‍රධාන අදහස විතරක් ඉදිරිපත් කරනවා. ප්‍රධාන වශයෙන් බුදුරජාණන් වහන්සේ කියන්නේ. "මම කියනවා අංග දහයකින් සමන්විත කෙනෙක් තමයි නියම ශ්‍රමණයා කියලා කියන්නේ. අර පරම තත්ත්වයට පැමිණි ශ්‍රමණයා කියල කියන්නේ. මොනවද අංග දහය? ඒ අංග දහය හැටියට දක්වන්නේ ඔය ආර්යඅෂ්ටාංගික මාර්ගයෙ අංග අට මේ පින්වතුන් කවුරුත් දන්නවා. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි ඔය අටට එකතුවෙනවා රහතන් වහන්සේ පිළිබඳව කථා කරන විට තවත් දෙකක්. 'දසහි අංගෙහි සමන්නාගතො අරහා හොති' කියල අංග දහයක් වෙනවා රහතන්වහන්සේ වෙනකොට. අනික් අංග සම්මා ඥාණ, සම්මා විමුත්ති. ඒ මාර්ගය කෙළවර කළාට පස්සේ අන්න සම්මා ඥාණ, සම්මා විමුත්ති කියන දෙකෙන් තමයි සම්පූර්ණ වන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගය, අපි අට ගැන නිතර කථා කළාට රහතන්වහන්සේට අර දෙකත් සඳහන් වෙනවා- සම්මා ඥාණ, සම්මා විමුත්ති, අන්න ඔය අංග වලින් යුක්ත ඒ කියන්නේ රහතන්වහන්සේ - උන්වහන්සෙයි මම නියම ශ්‍රමණයා හැටියට ප්‍රකාශ කරන්නේ කියලා බුදුරජාණන් වහන්සේ එතන පෙන්නුම් කරලා දෙනවා.

ඒ එක්කම එතනින් තවත් වැදගත් කාරණයක් හෙළිවෙනවා. ඒ දීර්ඝ විග්‍රහය තුළ කැපිල පෙනෙන කාරණයක් තමයි- ඒ ටිකයි අපට ඇත්ත වශයෙන් ප්‍රායෝගික වශයෙන් වැදගත් වෙන්නේ- පියවර රාශියක් එතැන දක්වනවා. රහතන්වහන්සේ ඒ තත්ත්වයට පැමිණෙන තාක් ගමන් කරන මාර්ගය. ඒ හැමතැනම දක්වෙන ප්‍රධාන කාරණය තමයි මේ පින්වතුන් අහලා තියෙනවා සතරාකාර සම්‍යක්ප්‍රධානය. මේ ප්‍රතිපදාවේ වැදගත්ම තැනක් ලැබෙන එකක් තමයි, අපි ඔය නොයෙකුත් වචන යොදන්නේ වීර්යය, ව්‍යායාමය, උත්සාහය, ප්‍රධාන ආදී නොයෙකුත් වචනවලින් කියන- මේ මනුෂ්‍යයා තුළ තියෙනවා යම්කිසි ශක්තියක්. විශේෂ ශක්තියක්. අර කුඩා දරුවාට නැති ශක්තියක් තියෙනවා එතකොට බුදුරජාණන් වහන්සේ ඒකයි මතුකරලා දෙන්නේ. අර එක් එක් පියවරක සංඝයාවහන්සේ රහත්තත්වයට පත්වනතාක් දක්වනවා ඒ ශ්‍රමණයෙක් විසින් කළයුත්තේ- දැන් මේ පින්වතුන් අහලා තියෙනවා සතර සම්මප්පධාන, සම්මා වායාම, ඒවා හඳුන්වන්නේ කෙටියෙන් අපි කිව්වොත් පාලිපාඨය නිතර අහලත් ඇති.

**'අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීයෝභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති.'**

ඉතින් ඕකේ සාමාන්‍ය අදහස- මේ වීර්යය සතර ආකාරයි. හැම මොහොතක් තුළම අපට ඉදිරිපත් වෙනවා ඇතුළතිනුත් පිටතිනුත් - අකුසලයට නැඹුරුවූ යම් යම් සිතුවිලි ඉදිරිපත් වෙනවා. ඒවා මැඩපවත්වන්නත් යම් වීර්යයක් යෙදිය යුතුයි. ඒවගේම අපි ඉදිරියට යන්න නම් එතනින් නවතින්නේ නැතිව භාවනා වශයෙන්- කොටින් කියතොත් මේ පින්වතුන් අහලා තියෙනවා ඔය හතර දක්වනවා **සංවර, පහාන භාවනා, අනුරක්ඛණ** නමින්. දැන් අපි කියාපු පාඨ හතරේ සාරය නිරන්තරයෙන් දක්වන්නේ ව්‍යායාමය උත්සාහය, වීර්යය ගැන කියනකොට ඒක සතර ආකාරයි. පළමුවෙනි වීර්යය යොදන්නේ සංවරකරගැනීම සඳහා. සංවරය කියන්නේ මොකක්ද? නූපන්නාවූ අකුසල් නූපදවීම සඳහා යම් ප්‍රයත්නයක් යෙදිය යුතුයි. දෙවෙනි එක ප්‍රහාණ කියන්නේ තමා ළඟ තිබෙන දනට තිබෙන අකුසල් ප්‍රහාණය, නැතිකර ගැනීම සඳහාත් ඒ වගේම උත්සාහයක් යෙදිය යුතුයි. ඊළඟට අපි යමක් ඉදිරියට කරන්න බලාපොරොත්තු වන නිසා නූපන්නාවූ කුසල් ධර්ම ළංකර ගැනීම- ඒවා උපදවා ගැනීම- සඳහාත් අර වගේම වීර්යයක් දැරිය යුතුයි. ඊළඟට හතරවෙනුව මෙතෙක් ඒ ලබාගත්තු යම් හොඳ දේවල් තිබෙනවා නම් ඒවා රැකගැනීම ආරක්ෂාකර ගැනීම සඳහාත් ඒ විධියටම උත්සාහයක් දැරිය යුතුයි.

අපි ඇතැම් අවස්ථාවල මේකට මේ පින්වතුන්ට තේරුම් ගන්න පුළුවන් මේ යුගයේ උපමාවක් දක්වලා තියෙනවා. දැන් මහතොටේ යනකොටත් දකින්න පුළුවන් ඔය පාලමක් එහෙම හදන තැන්වල ඉස්සරවෙලා කරන්නේ අනවශ්‍ය වතුර ඒවා මොන මොන ක්‍රම හරි යොදලා, පොම්ප යොදලා, ඒවා පිට කරනවා. ඊළඟට ගලාඑන වතුර- ගංගාවක් නම්- නිරන්තරයෙන් ගලාගෙන එන වතුර ඉස්සරවෙලා ඒක යම්කිසි බැම්මකින් වළක්වනවා. තියන වතුර ඉවත් කරනවා. නැවත වතුර ගලා නොඑන හැටියට බැම්මක් බඳිනවා. ඒ අතරතුර බඩු බාහිරාදිය ගෙනැල්ලා පාලම හදන්න, බෝක්කුව හදන්න, ඒ කටයුතු ආරම්භ කරනවා. ඒ කටයුතු ආරම්භ කරලා මූලික වශයෙන්, ඒ දළ වශයෙන් කරපු සැලැස්ම ඊළඟට තහවුරු කරගන්නවා හතරවෙනුව- හොඳට ඔය කොන්ක්‍රීට් දාලා. අන්න ඒ විධියේ දෙයක් මෙතන පෙන්නුම් කරන්නේ.

එතකොට මේ වීර්යය පිළිබඳ හතරාකාර පැත්තක්, සතරාකාර වීර්යයක්

මේ ධර්මයේ සඳහන් වෙනවා. නිරන්තරයෙන් සම්මා වායාම සමමපධාන ආදී වශයෙන් දක්වන්නේ. ඉතින් මේ වගේම මතුකරගන්න හොඳ වටිනා පද කීපයක් මෙතන කියවුනා. **ඡන්දං ජනෙති, වායමති, විරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති.** දැන් ඡන්දයක් ගැන කලිනුත් අපි සඳහන් කළා. මේ කියන ඡන්දය අපි කල්පනා කරන්න ඕනෑ ශාසනික අර්ථය ගත්තම අන්න අර අපිට පළමුවෙන්ම යමක් පිළිබඳව එන හිතුවිල්ල තමයි ඕනෑකම, කැමැත්ත. යම්කිසි දෙයක් කරන්න අපට ඉස්සරවෙලාම ඕනෑකරන්නේ 'මේක කරන්න ඕනෑ' කියන හිතට එන කැමැත්තක්, ඕනෑකමක්. නමුත් එපමණකින් ඒක සිද්ධවෙන්නේ නැති නිසා ඊළඟට අන්න බුදුරජාණන් වහන්සේ දක්වනවා- ඉස්සරවෙලාම ඇත්ත වශයෙන් කැමැත්තක් ඇතිකර ගැනීමත් ඇතැම් කෙනෙකුට අපහසුයි විශේෂයෙන්ම කුසල ධර්ම පිළිබඳව. කුසල ධර්ම පිළිබඳව ඡන්දයක් ඇතිකර ගැනීම බොහොම අපහසුයි. අකුසල ධර්ම ගැන නම් ඉබේටම ඡන්දය ලැබෙනවා. ඉතින් එහෙම ඡන්දය ඇතිකර ගත්තාට පස්සේ අන්න, එතන ඉඳලා යන ගමන ඊළඟට කියන්නේ '**ඡන්දං ජනෙති**', ඡන්දයක් උපදවා ගන්නව. ඊළඟට '**වායමති**' වෑයමක් දරනවා. මේ වෑයම කියන එක මේ ඔක්කොම ඇත්ත වශයෙන් අර උත්සාහය වීර්යය කියන අර්ථ තමයි. නමුත් අපට පෙනෙනවා මේවායේ යම් යම් අර්ථ. බුදුරජාණන් වහන්සේගේ හැම වචනයකම ගැඹුරු අර්ථයක් තිබෙනවා. මෙතන ක්‍රමානුකූලව වෑයම වැඩෙන හැටි මේ පෙන්නුම් කරන්නේ. ඕනෑකම තිබුණා. අර ඕනෑකම ඇතිකර ගත්තා. ඊළඟට දැන් වෑයමක් දරනවා කියන එකයි හිතාගන්න තියෙන්නේ. මේ සඳහා ඇතැම් අවස්ථාවල අපි ඔය ගලක් පෙරලන උපමාව එහෙම දක්වනවා. අපේ වැඩකටයුතුවලට බාධාවන ලොකු ගලක් එහෙම තියනවා නම් ඒක අහක්කරන්න ඕන කියන සිතුවිල්ල ඇතිවෙනවා. ඊළඟට 'මේක ඉවත්කරන්න මට පුළුවන්ද' කියලා දනගන්නත් යම්කිසි **ව්‍යායාමයක්** ඉස්සරවෙලා කරන්න ඕන. මේක යටට යමක් දාලා ඔසවන්න බලනවා. එතකොට ඔය කරන මූලික ප්‍රයත්නය තුළ තමන්ගේ අත් පා වලටත් යම් ශක්තියක් ලැබෙනවා **වෑයමක්**. මේ වෑයම තුළ ඒ වැඩේට ආරම්භය වගේම තමන්ගෙ ඊට මූලික සූදානමත් ඒකෙන් කියවෙනවා. මේ පින්වතුන් දන්නවා වැඩ කටයුතු කරන අය. වෑයමක් දරනවා. ඊළඟට වෑයම දරලා ඉවරවෙලා කරන්න පුළුවන් බවට යම්කිසි හැඟීමක් ඇති උනාම තමයි '**විරියං ආරභති**'. වීර්යයක් ආරම්භ කරනවා. වීර්යය කියන එක ප්‍රබල වචනයක්. එතකොට එතැනදී ඒ තමන්ගේ වීර්යය, ඒකනේ බුදුරජාණන් වහන්සේ **පුරිසථාමං, පුරිසවිරියං පුරිසපරක්කමං** ආදී වචන යොදන්නේ. ඒ වීර්යය ශක්තිය මතුකරගෙන අන්න මේ වැඩේට ඊළඟට කර - දෙනවා.

එහෙම කරගෙන යනකොට, වීර්යයක් යොදන විට, හැම වැඩේටම බාධානම් බලාපොරොත්තු විය යුතුමයි. ඒ බාධා ඉදිරියේ ඇතැම් කෙනෙක් හිත දුර්වල කරගෙන ඒක අතහරිනවා. නමුත් ඥානවන්ත පුද්ගලයා ඒ

අවස්ථාවේදී සිත දැඩිව පිහිටුවා ගන්නවා. අධිෂ්ඨාන ශක්තිය එතැනදී ඉදිරිපත් කර ගන්නවා. 'විරියං ආරභති' වීර්යය ඇරඹුවාට පස්සේ එන බාධක හමුවේ '**චිත්තං පග්ගණ්හාති**' සිත දැඩිව පිහිටුවාගන්නවා. මේක කරලා මිසක් අතහරින්නේ නැහැ කියලා. 'චිත්තං පග්ගණ්හාති'- සිත දැඩිව පිහිටුවා ගන්නවා.

ඊට පස්සේ තමයි එහෙම පිහිටුවා ගත්තට පස්සේ 'පධාන' - පධාන කියන වචනය මේ ශාසනයේ ඉතාමත්ම වටිනා වචනයක්. පොදුවේ අපි කිව්වට ඒක වීර්යයටම වෙන වචනයක් කියල මේ හැම වචනයකම තියෙනවා මහා පුදුම අර්ථ ශක්තියක්. ඒකනේ බුදුරජාණන් වහන්සේගේ අවසාන ප්‍රයත්නයට යොදන්නේ. ඒකට අපි වෑයම කියන්නේ නැහැ, වීර්යය කියලා කියන්නෙත් නැහැ, 'මහා පධාන' **මහා පධාන**. මොකද 'පධාන' කියන්නේ? අපි ඔය සිංහලට කියන 'ප්‍රධාන' කියන අර්ථය නොවෙයි පාලි භාෂාවේ සමහර වචන වල යම්කිසි වෙන අර්ථයක් තියෙනවා. පධාන කියල කියන්නේ 'පදහති' කියල අන්න අර දැඩිවම- **දැඩිවම**- යමක යෙදීම. ජීවිතපරිත්‍යාගයෙන් කරන එකක්. දැන් බුදුරජාණන් වහන්සේ පිළිබඳව මේ පින්වතුන් අහල ඇති ඒ අවසාන ප්‍රයත්නය ගැන සඳහන් කරන අවස්ථාවේ, 'සම්මප්පධානය' ගැන සඳහන් කරන අවස්ථාවේ, බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කරනවා මම චතුරංගසමන්නාගත වීර්යයක් යෙදුවා කියලා. අපි මේ චතුරංග සමන්නාගතවීර්යය කියල ව්‍යවහාර කරන්නේ එතන කියන අංග හතර මේ විධියටයි. බුදුරජාණන් වහන්සේගේ අධිෂ්ඨාන ශක්තිය තුළ තිබෙන ඒ අධිෂ්ඨාන කරන අවස්ථාවට යෙදූ වචන ආශ්‍රය කරගෙනයි මේ චතුරංගසමන්නාගත වීර්යය කියලා කියන්නේ. ඒ බෝධිමූලයේ දී එදා බුදුරජාණන් වහන්සේ සම්බෝධිය සඳහා වීර්ය කරන අවසාන අවස්ථාවේ මේ විධියට හිතුවයි කියලා කියනවා.

> **'කාමං තචොච නහාරුච අට්ඨිච අවසිස්සතු සරීරෙ උපසුස්සතු මංසලොහිතං, යං තං පුරිසත්ථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං න තං අපාපුණිත්වා විරියස්ස සන්ඨානං භවිස්සති'**

ඉතින් එතන කියවෙන්නේ 'එකාන්තයෙන් මේ මගේ ශරීරයෙහි හමත් නහරත් ඇටත් පමණක් ඉතිරිවේවා! මස් ලේ වියළී යේවා! යමක් ඒ පුරුෂථාමයෙන්, පුරුෂවීර්යයෙන්, පුරුෂ පරාක්‍රමයෙන් පැමිණිය යුතුද එතැනට නොපැමිණ මේ වීර්යයාගේ බහාතැබීමක් නම් නොවන්නේය' කියලා. එතකොට අපට හිතන්න තියෙන්නේ අර හතර ආකාරය කියලා ගත්තේ මොකද? සම, නහර ඇට කියලා අංග තුනක් තියෙනවා. මස් ලේ හතරවැනි එක. එතකොට අර තුන ඉතිරි වෙනවා මස් ලේ වියළී යනවා. ඕක ආශ්‍රයෙන් 'චතුරංගසමන්නාගත' කියන ව්‍යවහාරයක් ඇවිල්ලා තියෙනවා. ඉතින් ඔන්න ඒ වීර්යයයි පධාන වීර්යය කියලා කියන්නේ. තම තමන්ටත් එදිනෙදා

ජීවිතයේ ඔය කියාපු තමන්ගේ වැඩ කටයුතු- ඔය විශේෂයෙන්ම 'බරවැඩ' කරන පින්වතුන්ට- ඔය විධියේ අවස්ථා ආවාම තේරුම් ගන්න පුළුවන් අර හිත දුර්වල වුන අවස්ථාවේ ඒක කළයුතු දෙයක් නම් ඇත්ත වශයෙන් 'චිත්තං පග්ගණ්හාති' කියලා ඒ වෙලාවට තමයි අර තොල හැපෙන්නේ., තොල හපාගන මේක කරලා මිසක් ජීවිත පරිත්‍යාගයෙන්- 'මැරුණත් කමක් නැහැ' කියල එහා පැත්තට අන්තිමට අර ගල පෙරලන්න වගේ. 'මෙහා පැත්තට පෙරළුනොත්! අවදානම් වැඩේ, හැමෝටම බැහැ- ඒකට අතගහන්න. අන්න ඒ වෙලාවට තමයි අනිත් අය ඔක්කොම ඉවත්වන්නේ. 'නෑ මං කරන්නම්' කියන එක්කෙනා වීර්යවන්තයා. එතනදී අනිත් අය 'අපෝ! මේ පැත්තට පෙරළුනොත් අපි විනාශයි!' කියල දුවන අතරේ අර තැනැත්තා අර වීර්යය ඉදිරිපත් කරගෙන සිත දැඩිව පිහිටුවාගෙන 'මළත් කමක් නැහැ' කියල එහා පැත්තට තල්ලු කරනවා. ඒක තමා '**පධාන**' කියන්නේ. පදහති.

ඔන්න ඔය හතර, අර කියාපු පියවරවල් හතර පිළිබඳවත් සඳහන් වෙනවා. ඉන් අපට පෙනෙනවා නූපන්නාවූ අකුසල් නූපදවීම සඳහාත් අර විධියේ කැමැත්තක්, වෑයමක්, වීර්යයක් සිත දැඩිකර ගැනීමක්, පධාන වීර්යයක්, උත්කෘෂ්ට ප්‍රයත්නයක් අවශ්‍යවන බව. ඒ වගේම තමයි තමා ළඟ තිබෙන අකුසල්, නරක දේවල් ප්‍රහාණය කිරීම සඳහාත්, නූපදවීම සඳහාත්, ඒවා වළක්වා ගැනීම සඳහාත්, තිබෙන දේවල් නරක දේවල් ඉවත්කිරීම සඳහාත්, හොඳ දේවල් ලංකර ගැනීම සඳහාත්, අර වගේම වීර්යයක් දැරිය යුතුයි. ඊළඟට අවසාන වශයෙන් ඒවා තහවුරු කරගැනීම සඳහාත්, මොකද බුදුරජාණන් වහන්සෙ ප්‍රකාශ කරනවා 'ඨිතිම්පහං භික්ඛවෙ න වණ්ණෙමි පගෙව පරිහානිං' 'මේ කුසල් දහම් පිළිබඳව එකතැනක ඉඳීමවත් මම වර්ණනා කරන්නේ නැහැ. ආයි මේකෙ පරිහානිය ගැන කිවයුතු දෙයක් නැහැ.' ඒ කියන්නේ මේ වීර්යය පටන් ගත්තාට පස්සේ කෙළවරක් දකිනකන්, අතරතුර වීර්යය නොකඩවා ගෙන යායුතු බවයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ. ඒක සමහරවිට දක්වනවා- භික්ෂූන් වහන්සේ කෙනෙකුගේ අඩුපාඩුවක් හැටියට දක්වනවා- ඒ තමා ලබාගත්තු දේ ගැන සතුටුවීම් ප්‍රමාණය. සතුට කියන එක හොඳ තමයි. "නමුත් ලබාගත්ත තත්ත්වයෙන් සතුටට පැමිණීම මම වර්ණනා කරන්නෙ නැහැ. ඉදිරියට නොලබාගත්ත දේවල් පිළිබඳව වඩ වඩාත් වීර්යය දැරීමයි මම වර්ණනා කරන්නේ."

ඉතින් මෙයින් පෙන්නුම්කරනවා මේ ශාසනයේ ශ්‍රමණයකුට තියෙන කෘත්‍යය කොයි තරම් බැරෑරුම් කෘත්‍යයක්ද කියලා. අර පොඩ්දරුවෙක්- උඩුබැලිව නිදන පොඩ්දරුවකුගේ ඒ පාපකර්මයන් නොකර සිටීම, නරක වචන කථා නොකර සිටීම, ඊළඟට නරක සිතිවිලි නොසිතීම, නරක ජීවිකාවක් නොකිරීම කියන දේවල් පමණකින් අර උග්ගාහමාන පරිබ්‍රාජකයා ශ්‍රමණයෙක් මැන්නා. මේ කාලයේ පවා, මේ පින්වතුන් පවා බොහෝවිට ඇදී යන යම්

යම් දර්ශන තිබෙනවා. ඔන්න ඔය වගේ අතපය හකුලාගෙන ඉඳීමෙන් පමණක් අපට මේ ඔක්කොම කරගන්න පුළුවන් කියල. දැන් සාමාන්‍යයෙන් තරුණයින්ගේ සිරිතක් තියෙනවා. අපි ළඟටත් ඇවිල්ලා යම්කිසි දේවල් සාකච්ඡා කරනකොට 'අනේ අපි නම් වරදක් කරන්නේ නැහැ'. වරදක් කරන්නේ නැහැ. ඉතින් ඒ දර්ශනයම තමා බොහෝ විට තිබෙන්නේ. ඒක තවත් දුරට ගෙනිහිල්ලා **අර දරුවාගේ තත්ත්වය මාර්ගඵල තත්ත්වය කියලත් සමහර කෙනෙක් කල්පනා කරනවා.** මොකද අර ළදරුවා අහිංසකයි නේ. අහිංසක වුනාට බුදුරජාණන් වහන්සේ වෙන තැන්වල දක්වලා තිබෙනවා දැන් මෙතනම වුනත් අර දරුවාගේ අර පොඩි දඟලීම, අර ඇඬීම, අර සිනාසීම, අර මව්කිරිවලට තියන දැඩිලෝභය ඒ ඔක්කොම කෙලෙස් නිසයි වෙන්නේ, ඒ මට්ටමින් සංසාරයේ ආපු අනුසය නිසා. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා මේ ශාසනික කෘත්‍යය බැරෑරුම් එකක් වෙන්නේ මේක යට තිබෙන දීර්ඝ කාලයක් සංසාරයේ අපේ චිත්ත සන්තානයේ තිබෙන 'අනුසය ධර්ම' 'ආශ්‍රව' ආදී ඔය වචනයෙන් දක්වන ඒවායේ බැරෑරුම්කම නිසයි. මේක ලේසි වැඩක් නොවෙයි. ඒ ලේසි නොවන නිසා තමයි අර තරම් වචන සමූහයක් බුදුරජාණන්වහන්සේට යොදන්න වුනේ මේ වීර්යය පිළිබඳව- වීර්යය පිළිබඳ කතන්තරයට.

ඉතින් ඔය හතරාකාර වීර්යය. දැන් අර කිව්ව පාලමක් හදන්න පවා කොයි තරම් වෙහෙසෙනවාද කියලා මේ පින්වතුන් දන්නවා. හතරආකාර- අර හතර පැත්තෙන්ම වැඩ කෙරෙන්න ඕනෑ. ඒ එකක්වත් අඩුවුනොත් මේ වැඩේ කරගන්න බැහැ. හැම මොහොතක්ම ඉදිරිපත්වෙන්නේ ඒ විධියටයි. අපි කරන්න යන වැඩට නානා විධ බාධක එනවා. ඒ වගේ තමයි මෙතනදිත් නිර්වාණය කියලා කියන්නේ අර සිත පිරිසිදුකර ගැනීම නම්- අර බුදුරජාණන් වහන්සේ දක්වන ඒ උතුම් පරමාර්ථය නම්- ඒකට යන මාර්ගයේ ඔන්න ඔය සම්මප්පධාන, සම්මා වායාම කියන එකට විශාල තැනක් ලැබෙනවා. වැදගත්ම තැනක්. ප්‍රතිපත්තිය කියන්නේ එතනයි. මාර්ගය කියන්නේ එතනයි. ඒකයි මෙතන මාර්ග කථාවෙන්මයි මේ ශ්‍රමණය හඳුන්වලා දීලා තිබෙන්නේ. 'මග්ගජිනො' අන්න බුදුරජාණන් වහන්සේ අර කියාපු චතුරංගසමන්නාගත වීර්යයෙන් ඒ මාර්ගය සොයා ගෙන අනිත් අයටත් ප්‍රකාශ කරන්න තරම් 'මග්ගජිනො.' ඒ තත්ත්වය ලබාගත්තා. දෙවෙනි ස්වාමීන්වහන්සේ මාර්ගය භය නැතිව අනිත් අයට සැක සිඳෙන අන්දමට තේරුම් කරලා දීලා ලෝකයේ පරම දේ උතුම් දේ මොකක්ද කියලා තමන්ගේ ප්‍රත්‍යක්ෂය තුළින් පැහැදිලිව කියාදෙන්න පුළුවන් ශක්තිය ඇතිකෙනා තමයි 'මග්ගදෙසකො'. තුන්වැනිව කියාපු ඒ සේඛ ස්වාමීන්වහන්සේලා මාර්ගයේ ගමන් කරන, නිරවද්‍ය ධර්ම පදය, ප්‍රතිපත්තිය, සතිපට්ඨාන ආදියේ හැසිරෙමින් ඒත් ඒ මාර්ගයේ කළයුතු අර වීර්යය කරගෙන යන අය. ඊළඟට හතරවෙනිව අන්න අර කියාපු කට්ටිය

තමයි 'ප්‍රතිරූපක'- මාර්ගයක් තියෙන බවවත් නොදන, මාර්ගයේ යන හැටියට පෙන්වන, අර බුදුරජාණන් වහන්සේ මහා භයානක- කෙනෙකුට භය හිතෙන අන්දමේ- උපහාසයක් අතන දක්වලා තියෙන්නේ. අර කොටළුවත් ගවයත් පිළිබඳව. බුදුරජාණන් වහන්සේ මහා කාරුණික නමුත් එතන සියුම් උපහාසයක් දක්වලා තියෙන්නේ. 'අහම්පි අම්හා, අහම්පි අම්හා' කියලා අර කොටළුවා ගවරැල පිටිපස්සේ යන උපමාවයි දීල තියෙන්නේ.

ඉතින් අපි කල්පනා කරන්න ඕනෑ ශ්‍රමණකෘත්‍යය කියන්නේ මොකක්ද කියලා. මොකක්ද මේ බුදුරජාණන් වහන්සේ බුදුවීම තුළින්, සම්බෝධිය තුළින්, ලෝකයාට ඉදිරිපත් කළේ. අපි බුදුරජාණන්වහන්සේ අද්විතීය කියන්නේ එතකොටයි. බුදුකෙනෙක් පහළවෙනකන් අතිකුත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් බලාගන හිටියේ මොකද? ඒ කට්ටියට තෝරගන්න බැරිව තිබුන යම්කිසි ගැටළුවක් තිබුනා. ඒ අයට පෙනුන- ඔය ධ්‍යාන අභිඥා දියුණු කරගත්තු ඒ ශ්‍රමණයින්ට පෙනුනා- සියදහස් ගණන් අතීත ජාති. මේ සංසාරයේ දීර්ඝකාලයක් අපි ඇවිල්ලා තිබෙනවා. ඒ පෙනුනේ හරියට ගෙයින් ගෙයකට යන්නා වගේ. ආත්ම සංඥාව. ඒ මිථ්‍යා වැරදි අදහසක් එතැන තිබුනේ සක්කාය දිට්ඨිය නිසා. මම මෙන්න මේ මේ ආත්මවල මෙන්න මෙහෙම ගියා කියල. ඊට එහාට ඉතින් මේක සසර දුකක් බවත් එක්තරා ප්‍රමාණයකට තේරුනා. නමුත් මේකෙ විසඳුමක් ඒ අයට පෙනුනේ නැහැ. බුදුරජාණන් වහන්සේ පමණයි එතකොට චතුරාර්ය සත්‍යය තුළින්, ඒ පටිච්චසමුප්පාද ධර්මය තුළින්, මෙතෙක් ලෝකයේ කිසිවෙක් ඉදිරිපත් නොකළ ඒ ගැඹුරු ධර්මය තුළින්, ලෝකයේ යථාස්වභාවය ලෝකයාට හෙළිකළේ. ඒ චතුරාර්ය සත්‍යය තුළ තිබෙනවා එතකොට ඒ පැවැත්ම සමස්තයක් වශයෙන් ගත්තාම 'සංඛිත්තෙන පඤ්චුපාදානඛන්ධා දුක්ඛා' කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ වචනය. ඇතැම් කෙනෙක් පිළිගන්න අකමැති වුනත් ඒක සත්‍යයි. මොකද බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා සංසාර පැවැත්ම, සසර පැවැත්ම, එහෙමපිටින්ම දුකක් බව. ඊළඟට මේ පැවැත්මට තියෙන තණ්හාව මේ තණ්හාව නිසයි- 'තණ්හා පොනොභවිකා' කියලා කියනවා. නැවත නැවත මේ ජීවිතයේ අපට ලබාගන්න බැරිවුන දේ අපි මැරෙන අවස්ථාවේ ඊළඟ ජීවිතයේදීවත් ලැබේවා කියා ඒ ප්‍රාර්ථනාව- සෑහීමක් නැ තෘෂ්ණාව. ඒක නිසා ඒ ප්‍රාර්ථනාව නිසාම අර කර්ම ශක්තීන් තුළින් නැවත උත්පත්තිය ලැබෙන බවයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරලා තියෙන්නේ. අන්න ඒක නිසා ඒ තණ්හා ප්‍රහාණයම - තණ්හාව කියලා කියන ඒ පිපාසය සංසිඳවා ගැනීමම- නිවන බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා.

මේ එහෙම පිටින්ම හරියට- ගින්නක් නිවන්න දර දමන්න වගේ. නිවන්න ඕනෑ ගින්නට අපි පිදුරු දමනවා. දර දමනවා. තව තවත් ගින්න වැඩෙනවා. ඒ වගේ තමයි තෘෂ්ණාව නැතිකර ගැනීම සඳහා ලෝකයා දරණ

උත්සාහය බුදුරජාණන්වහන්සේට පෙනුනේ. තෘෂ්ණාව නැතිකර ගැනීම සඳහා නොයෙකුත් 'උපාදාන' මේ අල්ලා ගන්නා දේ හැම එකක්ම තව තවත් ගිනිජාලා බවට පත්වෙලා තම තමන් ඒවා තුළ දැවෙනවා. එතකොට ඒක තමයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ මේ ලෝකය හැමතැනම 'සබ්බං ආදිත්තං' ආදි වශයෙන් ප්‍රකාශ කළේ. හැමතැනම ගිනිඅරගෙනයි කියලා. බුදුරජාණන් වහන්සේට පෙනුනා. ඇස කණ නාසය ආදී හැම තැනම ගිනි අරගත්ත හැටියට බුදුරජාණන් වහන්සේට ඒ බුද්ධ ඥාණයට පෙනුනා. එතකොට ඒ ගින්න නිවීමයි මෙතැන ප්‍රකාශ කරන්නේ. ගින්න නිවීමට නම් අර කියාපු තණ්හාව සංසිඳුවා ගන්න ඕනෑ. තණ්හාව සංසිඳුවා ගැනීම සඳහා තමයි තමාගේ පුද්ගල සන්තානය පිළිබඳව- පුද්ගල පෞරුෂය පිළිබඳව- පරිපූර්ණ පරිවර්තනයක් කරන්න ඕන වෙන්නේ. ඒ පරිවර්තනය තමයි අන්න ආර්ය අෂ්ටාංගික මාර්ගය. පළමු වෙනි පියවර හැටියට ඒ ආර්ය අෂ්ටාංගික මාර්ගය අපි මාර්ගය හැටියට දක්වන්නේ. ඒ ප්‍රතිපදාවේ අවසානය ඒක සම්පූර්ණ වුන අවස්ථාවෙයි, අන්න අංග දහය වන්නේ. ඒක සම්පූර්ණ කළ අවස්ථාවේ රහතන්වහන්සේට සම්මා ඤාණ, සම්මා විමුත්ති. ඒකෙන් අංග දහය සම්පූර්ණ වුනාම පැවිදි කෘත්‍යය සම්පූර්ණයි.

ඔන්න ඔහොම ශ්‍රමණ කෘත්‍යය අපි තේරුම් ගන්න උත්සාහ කරමු. ශ්‍රමණයන් හැටියට බුද්ධ කාලයේත් ඒ ඒ විධියට ශ්‍රමණයන් ශ්‍රමණයන් කිව්වත් බුදුරජාණන් වහන්සේ ශ්‍රමණයින් හැටියට සැලකුවේ කවුද කියන එක එතකොට මේ තුළින් අපට තේරුම් ගන්න පුළුවන්.

අද මේ වටිනා දවසේ මේ පින්වතුන් ශාසනයක් රකිනවා නම් ශාසනය හඳුනාගන්න ඕන. එතකොට ඒ සඳහා උපකාරවන යම් යම් ධර්ම කාරණා මේ දේශනාව තුළින් දැනගන්න ලැබුනා කියලා බලාපොරොත්තු වෙනවා. එතකොට තම තමන්ගේ අර කියාපු ශ්‍රද්ධාව නැතිකරගන්නේ නැතිව. ශ්‍රද්ධාව වඩාගෙන මේ ධර්ම මාර්ගයේ යන්න උත්සාහවත් වෙන්න ඕන. මෙතෙක් මේ අද දවසේ තමන්ගේ ප්‍රමාණයෙන් ඒ රැක්ක සීලය, කළ භාවනාව, මේ ඇසූ ධර්මය, ලබාගත්තු පිහිට උපකාර කරගෙන මේ පින්වතුන් තමතමන්ගේ භාවනා මස්තකප්‍රාප්ත කරගෙන මේ ශාසන පරිහානියට කලින් සෝවාන් සකදාගාමී අනාගාමී අර්හත් කියන මාර්ගඵල ප්‍රතිවේධයෙන් උතුම් අමාමහ නිවන සාක්ෂාත් කරගැනීමට අධිෂ්ඨාන කරගන්න ඕන. ඒකට උපනිශ්‍රය කරගන්න ඕන. අවීචියේ සිට අකනිටාව දක්වාවූ යම්තාක් සත්ත්වකෙනෙක් මෙවැනි ධර්මදේශනා ශ්‍රවණය කිරීමට, අනුමෝදන්වීමට, කැමති නම් ඒ අනුමෝදන්වීම තුළින් තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියත් සාක්ෂාත් කරගනිත්වා කියලා ප්‍රාර්ථනා කරමු. මේ ගාථා කියන්න.

එත්තාවතාව අමෙහහි............

# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකරන ලද ග්‍රන්ථ

| | ග්‍රන්ථ නාමය | | පිටපත් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | නිවනේ නිවීම | පළමු වෙළුම | 11000 |
| 02. | නිවනේ නිවීම | දෙවන වෙළුම | 8000 |
| 03. | නිවනේ නිවීම | තෙවන වෙළුම | 5000 |
| 04. | නිවනේ නිවීම | සිවුවන වෙළුම | 6000 |
| 05. | නිවනේ නිවීම | පස්වන වෙළුම | 5000 |
| 06. | නිවනේ නිවීම | සයවන වෙළුම | 3500 |
| 07. | නිවනේ නිවීම(පුස්තකාල මුද්‍රණය) | ප්‍රථම භාගය(1-6වෙළුම්) | 500 |
| 08. | නිවනේ නිවීම | සත්වන වෙළුම | 3000 |
| 09. | නිවනේ නිවීම | අටවන වෙළුම | 3000 |
| 10. | නිවනේ නිවීම | නවවන වෙළුම | 5000 |
| 11. | නිවනේ නිවීම | දසවන වෙළුම | 5000 |
| 12. | නිවනේ නිවීම | එකොළොස්වන වෙළුම | 3000 |
| 13. | නිවනේ නිවීම (පුස්තකාල මුද්‍රණය) | (1-11වෙළුම්) | 1500 |
| 14. | පහන් කණුව ධර්ම දේශනා | පළමු වෙළුම | 13000 |
| 15. | පහන් කණුව ධර්ම දේශනා | දෙවන වෙළුම | 12000 |
| 16. | පහන් කණුව ධර්ම දේශනා | තෙවන වෙළුම | 10000 |
| 17. | පහන් කණුව ධර්ම දේශනා | සිවුවන වෙළුම | 11000 |
| 18. | පහන් කණුව ධර්ම දේශනා | පස්වන වෙළුම | 10000 |
| 19. | පහන් කණුව ධර්ම දේශනා | සයවන වෙළුම | 8000 |
| 20. | පහන් කණුව ධර්ම දේශනා | සත්වන වෙළුම | 4000 |
| 21. | 'හිතක මහිම' | පළමු වෙළුම | 8000 |
| 22. | 'හිතක මහිම' | දෙවන වෙළුම | 5000 |
| 23. | උත්තරීතර හුදෙකලාව | | 12000 |
| 24. | විදසුන් උපදෙස් | | 8000 |
| 25. | චලන චිත්‍රය | | 3000 |
| 26. | දිය සුළිය | | 6000 |
| 27. | මනසේ මායාව | | 4000 |
| 28. | භාවනා මාර්ගය | | 4000 |
| 29. | Towards A Better World | | 6000 |
| 30. | Seeing Through | | 3000 |
| 31. | Nibbana - The Mind Stilled | Volume I | 5000 |
| 32. | Nibbana - The Mind Stilled | Volume II | 3000 |
| 33. | Nibbana - The Mind Stilled | Volume III | 3000 |
| 34. | Nibbana - The Mind Stilled | Volume IV | 5000 |
| 35. | Nibbana - The Mind Stilled | Volume V | 2000 |
| 36. | Nibbana - The Mind Stilled | Volume VI | 2000 |
| 37. | The Magic of the Mind | | 2000 |
| 38. | Towards Calm and Insight | | 2000 |
| 39. | Samyutta Nikaya An Anthology | | 2000 |
| 40. | Ideal Solitude | | 2000 |
| 41. | Nibbana and The Fire Simile | | 3000 |


නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම් :-

ජී. ටී. බණ්ඩාර, ස්ථාපක, ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය

රෝයල් ඉන්ස්ටිටියුට්, 191, හැව්ලොක් පාර, කොළඹ 5.

011 2502747, 2502748, 2508173 Fax : 2580564

# කතෘ හිමියන්ගේ සිංහල සහ ඉංග්‍රීසි කෘති

*1. උත්තරීතර හුදෙකලාව - (මුල් මුද්‍රණය)දම්සක්' අංක 172/173 - (1990)
-එම- (නව මුද්‍රණය), ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය (2001)
2. විදසුන් උපදෙස් - (1997)
3. නිවනේ නිවීම - පළමු වෙළුම (1997)
4. නිවනේ නිවීම - දෙවන වෙළුම (1998)
5. නිවනේ නිවීම - තෙවන වෙළුම (1998)
6. නිවනේ නිවීම - සිවුවන වෙළුම (1998)
7. නිවනේ නිවීම - පස්වන වෙළුම (1999)
8. නිවනේ නිවීම - සයවන වෙළුම (1999)
9. නිවනේ නිවීම - සත්වන වෙළුම (1999)
10. නිවනේ නිවීම - අටවන වෙළුම (2000)
11. නිවනේ නිවීම - නවවන වෙළුම (2001)
12. නිවනේ නිවීම - දසවන වෙළුම (2002)
13. නිවනේ නිවීම - එකොළොස්වන වෙළුම (2004)
14. නිවනේ නිවීම - පුස්තකාල මුද්‍රණය - ප්‍රථමභාගය - (1-6 වෙළුම්)(2000)
15. නිවනේ නිවීම - පුස්තකාල මුද්‍රණය (1-11 වෙළුම්) (2010)
16. පහන් කණුව ධර්ම දේශනා - 1- වෙළුම - (1999)
17. හිතක මහිම - 1 - (1999)
18. හිත තැනීම - (2000)
19. පහන් කණුව ධර්ම දේශනා - 2 වෙළුම - (2000)
20. පැවැත්ම හා නැවැත්ම - (2000)
21. ඇති හැටි දැක්ම - (2001)
22. පහන් කණුව ධර්ම දේශනා - 3 වෙළුම - (2001)
23. දිවි කතරේ සැඳෑ අඳුර - (2001)
24. කය අනුව ගිය සිහිය - (2001)
25. මා-පිය උවැටන - (2002)
26. ප්‍රතිපත්ති පූජාව - (2003)
27. පහන් කණුව ධර්ම දේශනා - 4 වෙළුම - (2003)
28. අබිනික්මන - (2003)
29. හිතකමහිම - 2 - (2003)
30. පහන් කණුව ධර්ම දේශනා - 5 වෙළුම (2005)
31. පහන් කණුව ධර්ම දේශනා - 6 වෙළුම (2006)
32. පහන් කණුව ධර්ම දේශනා - 7 වෙළුම (2009)
33. බුදු සමය පුද්ගලයා හා සමාජය (2009)
34. මනසේ මායාව (2010)
35. භාවනා මාර්ගය (2011)

*1. Concept and Reality in Early Buddhist Thought -(1971)
*2. Samyutta Nikaya - AnAnthology, Part II - Wheel No, 183/185 -(1972)
- do - D. G. M. B. Edition (2009)
*3. Ideal Solitude - Wheel No, 188 - (1973)
*4. The Magic of the Mind - (1974)
- do - D. G. M. B. Edition (2007)
5. Towards Calm and Insight - (1991)
- do - D. G. M. B. Edition (1998)
6. From Topsy - turvydom to Wisdom -Volume 1 - (2003)
7. Seeing Through (1999)
8. Towards A Better World (2000)
9. Nibbana - The Mind Stilled - Volume I - (2003)
10. Nibbana - The Mind Stilled - Volume II - (2005)
11. Nibbana - The Mind Stilled - Volume III - (2005)
12. Nibbana - The Mind Stilled - Volume IV - (2006)
13. Nibbana - The Mind Stilled - Volume V - (2007)
14. Nibbana - The Mind Stilled - Volume VI - (2010)
15. Nibbana and The Fire Simile (2010)

* Buddhist Publication Society, P.O. Box. 61, Kandy